# සූත්‍ර අනුසාරයෙන් ගැටළු විසඳා ගැනීම

## 31.03.2018 ශ්‍රී ලංකාරාමය

## නවසීලන්තය

ශ්‍රද්ධාවන්ත පිංවතුනි, සැමදෙනාටම තෙරුවන් සරණයි!

දහවල් දානයෙන් පස්සේ මේ පිංවත් සැමදෙනාටම අපි ධර්ම කරුණු ටිකක් කියලා දෙනවා. ධර්ම සාකච්ඡාවක් පැවැත්වෙන වේලාවයි මේ. අපි මේ කියලා දෙන ධර්ම කරුණුවලින් සැම දෙනාටම ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ නිර්මල තථාගත ධර්මය තේරුම් ගන්ට වටහා ගන්ට ලැබේවා! මේ පින්වතුන් සැම දෙනාටම මේ ලබා ගත්ත මනුෂ්‍ය ජීවිතියෙන් අපි හමුකරගෙන තිබෙන බුද්ධ සාසනයෙන් නියම දහම් ඵල නෙලාගෙන චතුරාර්ය සත්‍යය ධර්මයන් අවබෝධ කරගෙන අමා මහ නිවනින් සැනසෙන්ට ලැබේවා! කියලා අපි මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා, ප්‍රාර්ථනා කරනවා.

මේ වෙලාවට අපි කරන්නේ සූත්‍ර සාකච්ඡාවක්. එහෙම නම් අපි සූත්‍ර සාකච්ඡාවත් ප්‍රශ්න සාකච්ඡාවත් දෙක එකට කරමු. හොඳයි එහෙමනම් දැන් අවස්ථාව තිබෙනවා ප්‍රශ්න අහන්න.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස කායසංස්ඛාර ආශ්වාස ප්‍රාශ්වාස කියලා සමහර තැන්වල තිබෙනවා. සමහර තැන්වල තිබෙනවා කයෙන් කරන ක්‍රියා කියලා. ඒ දෙක ගැන දැනගන්න කැමතියි.

<u>පිළිතුර</u> - ඔව්, අනාපානසතියට අනුකූලව ගත්තහම ආශ්වාස ප්‍රාශ්වාස තමයි කාය සංඛාර. කයට සම්බන්ධව කරන්නාවූ සියලුම දේවල් කාය සංඛාරයි. ඒක නිසා තමයි ආශ්වාස ප්‍රාශ්වාස දෙක කාය සංඛාර කියලා කියන්නේ.

<u>ප්‍රශ්නයක්</u> - සමහර ප්‍රසිද්ධියක් දරන පුද්ගලයින් කියනවා 'මේක තමයි බුදුරජාණන්වහන්සේගේ එකම ධර්මය. මේක තමයි ඒ මාර්ගය. මේක තමයි ඒ මාර්ගයේ යන සලකුණු කියලා. ඒවගේම කියනවා වැසී තිබුණ නිවන් මග

මේකයි, මේක තමයි නියම ධර්මය කියලත් ප්‍රකාශ කරනවා. ඉතින් මේවගේ කෙනෙක් බොහොම නිර්භීතව ප්‍රකාශ කරහම කොහොමද අපි ඒක නිවැරදිද කියලා තෝරා බේරා ගන්නේ? ඒකට යම්කිසි ක්‍රමවේදයක් තියෙනවද අපිට පාවිච්චි කරන්න පුළුවන්?

<u>පිළිතුර</u> - ඒ ගැන සලකා බලන්න තියෙන්නේ මේ විදියටයි. ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ කාලෙදිත් එක එක අය යම් යම් දේවල් ප්‍රකාශ කළා. ඊට පසු කාලීනවත් යම් යම් දේවල් ප්‍රකාශ කළා. අද කාලෙත් ප්‍රකාශ කරනවා. හෙටත් ප්‍රකාශ වේවි. ඒක තමයි ස්වභාවය. ඉතින් බුදුරජාණන්වහන්සේගේ ශ්‍රාවකයෝ හැටියට අපිට ඒ වගේ දෙයක් ප්‍රකාශ කළහම ඒ දිහා බලන්න ඕනේ විදියත් අපිට බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තිබෙනවා. අපි ඒකට අනුගත වෙලා බලනවා ඇරෙන්න වෙන දෙයක් කරන්න හොඳ නෑ.

අපි ඉස්සෙල්ලා බලමු අපි කොතනද ඉන්නේ, අපි මොකක්ද කරන්න ඕනේ කියලා. මම සූත්‍රයක් කියන්න හිතාගෙන හිටියා. ඒක ගත්තොත් හොඳයි මේ වෙලාවට කියලා හිතෙනවා. මේ පින්වතුන් ඒ ප්‍රශ්නයට පිළිතුරු හොයන්න කලින් මේක ගැන හිතන්න. කිසි තැනක අසරණ වෙන්න එපා. අනාථ වෙන්න එපා. බුදුරජාණන්වහන්සේගේ දේශනාව අපිට පිහිට වෙනවා. අපි නමස්කාරය කියලා මේ සූත්‍රය කියමු.

<u>නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස</u>
<u>නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස</u>
<u>නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස</u>

මේ සූත්‍ර දේශනාව මම මේ පින්වතුන්ට කියලා දෙන්නේ කරුණු කීපයක් සලකලයි. බුදුරජාණන් වහන්සේගේ තථාගත ධර්මය රැක්කේ, ගොනුකලේ රහතන්වහන්සේලා. පළවෙනි ධර්ම සජ්ඣායනාව පැවැත්වෙන්නේ බුදුරජාණන්වහන්සේ පිරිනිවන්පාල මාස තුනකින්. ඒක සිද්ධ වෙන්නේ රජගහනුවර සප්තපර්ණී ගුහාවේදී මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන්. ආනන්ද ස්වාමීන්වහන්සේ, උපාලි ස්වාමීන්වහන්සේ, සැරියුත් ස්වාමීන්වහන්සේගේ ශිෂ්‍ය භික්ෂුන්වහන්සේලා ඇතුළු තවත් බොහෝ රහතන් වහන්සේලා සහභාගි උනා. අජාසත්ත රජතුමාගේ අනුග්‍රය ඉතා හොඳට ලැබුණා. අජාසත්ත රජතුමාවත් දැනුවත් කරලා සංඝ තීරණයක්

අරගත්තා රජගහනුවර වස් වසන්ට ඕනෑ වෙන්නේ හාමුදුරුවරු 500 විතරයි කියලා. රජගහනුවර තිබෙන්නේ කඳු වළල්ලකින් වටවෙලා. ඒ කඳු වළල්ලේ තිබෙනවා තැන් තැන් වලින් ඇතුල්වෙන්න පුළුවන් කපොලු. ඒ නුවර පිහිටි ආකාරය හරියට බේසමක් වගේ. අහල තිබෙන ආකාරයට පිංවතුන් පහළ වෙන කාලයට පමණයි ඒ ප්‍රදේශය නාගරීකරණය වෙන්නේ. අනිත් කාලවල ඒක වනාන්තර බවට පත්වෙනවා. අදත් ඒක වනාන්තර ගතවෙලා. පොඩි කඩ මණ්ඩි දෙක තුනක් තිබෙනවා එච්චරයි. ඒකෙ තිබෙනවා ගිජ්ජකූට පර්වතය, බිම්බිසාර රජතුමා වැඩහිටි ඒ මාළිගාවේ ඉතිරිවෙලා තිබෙන නටබුන්. තවත් පොළොව අස්සේ තිබෙන දේවල් මතු කරලා නැහැ. ඔක්කොම කැලේ වැවිලා තිබෙන්නේ. සප්තපර්ණී ගුහාවටත් යන්න පුළුවන්. කඳු වළල්ලේ උඩ border එක තමයි සීමාව. කඳු මුදුන වටේ සීමාවේ ලොකු ගල් බැම්මක් බැඳල තිබෙනවා. හතර වටේ බැලුවහම ඉතිරි වෙච්ච ඒවා පේනවා. රජගහනුවරට ඇතුල්වෙන්න දකුණෙන් ගේට්ටුවක් තිබෙනවා, නැගෙනහිරින් ගේට්ටුවක් තිබෙනවා, උතුරෙන් ගේට්ටුවක් තිබෙනවා, බටහිරෙන් ගේට්ටුවක් තිබෙනවා. ඔය ගේට්ටු හැන්දෑවට වහනවා. දැන් ගේට්ටු නෑ හැබැයි ගේට්ටු තිබුණ තැන්වල ගල් වැටි තිබෙනවා.

මේ සිද්දිය උනේ කොහොමද කියලා පිංවතුන් දැන ගන්න. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ සහ මහා සංඝයා තීරණය කළා බුදුරජාණන්වහන්සේ පිරිනිවන්පෑවට පස්සේ එන වස් තුන් මාසෙදි රජගහනුවර ඇතුලත ඉන්න ඕනේ මහරහතන්වහන්සේලා 500 ක් විතරයි කියලා. මහරහතන්වහන්සේලා 500 දෙනාම ඒ සප්තපර්ණී ගුහාවේදී ධර්මය සජ්ඣායනා කරනවා පිළිවෙලකට. ඒකට හේතුව ඒ ස්වාමීන්වහන්සේලා රහතන්වහන්සේලා වාගේම උන්වහන්සේලා ත්‍රිපිටක ධාරීයි. අනිත් එක තමයි රහතන්වහන්සේලා කවදාකවත් බොරු කියන්නේ නෑ. අසත්‍ය දෙයක් ප්‍රකාශ කරන්නේ නෑ. ඒක නිසා බොරුවක් එකතු වෙන්නේ නෑ. බුදුරජාණන්වහන්සේ දෙසූ දෙයක් අතහරින්නෙත් නැහැ. නොදෙසූ දෙයක් එක්කාසු කරන්නෙත් නෑ. පනවපු දෙයක් නොපැනවූවා කියලා කියන්නේ නෑ. නොපැනවූ දෙයක් පැනවූවා කියලා කියන්නේ නෑ. ඒක නිසා ධර්මයේ ස්ථාවරත්වයේ පිහිටියාවූ හිත් ඇති සහ **'අර්ථ' 'ධම්ම' 'නිරුක්ති' 'ප්‍රතිභාන'** කියන්නාවූ සිව් **පිළිසිඹියාපත් ඥාන** ධර්මයන්ගෙන් යුක්ත වෙච්ච ත්‍රිපිටකධාරී රහතන්වහන්සේලා 500 දෙනෙක් තමයි ඒ දහම් සභාවට වැඩියේ. ඒ ස්වාමීන්වහන්සේලා ධර්මයයි විනයයි දෙක සජ්ඣායනා කළා.

එතැනදී ආනන්ද ස්වාමීන්වහන්සේගෙන් අහනවා කොතැනදීද මේක දේශනා කළේ , අරමුණ කුමක්ද, කවුරු අරභයාද කියලා. ආනන්ද හාමුදුරුවෝ ඒ සියල්ලටම පිළිතුරු දෙනවා. ඒ විදියට දේශනා කරලා රැකපු ධර්මයක් තමයි අපිට තිබෙන්නේ. ඒ රහතන්වහන්සේලා 500 දෙනාට අපි

අදත් ගෞරව කරන්න එපායැ. ඇත්තටම මම ගරු කරන්නේ ඒ රහතන්වහන්සේලාටයි. මම අදත් වඳින්නේ, නමස්කාර කරන්නේ, ගෞරව කරන්නේ ඒ ධර්මය සජ්ඣායනා කළාවූ, ඒ ධර්මය රැකපු ඒ ගෞරවණීය මහරහත්වහන්සේලා 500 දෙනාට. හේතුව, මේ දැන් අපිට තිබෙන ධර්මයේ මූලික ආරම්භක ස්වාමීන්වහන්සේලා තමයි ඒ. ඒකට 500 දෙනා වහන්සේලා එකතු උන නිසා ඒකට **'පංචසතික සජ්ඣායනාව'** කියලා කියනවා. ඊට පස්සේ අවුරුදු 100 යනවා. මෙහෙම අවුරුදු 100 යනකොට වෙනත් වෙනත් මතිමතාන්තර දරාපු අය බිහි උනා. ඉන්දියාව කියන්නේ බ්‍රාහමණයන්ගෙන්, වෙන වෙන ආජීවකයන්ගෙන් සහ නිගණ්ඨයන්ගෙන් පිරිච්ච රටක්. නිගණ්ඨයෝ ලංකාවේ නෑ. ආජීවකයොත් ලංකාවේ නෑ. අද කාලේ හැටියට කතෝලික ක්‍රිස්තියානි මුස්ලිම් වගේ පොඩි පොඩි ඇදහිලි කරන්නාවූ අය පමණයි ලංකාවේ ඉන්නේ. ඒත් ඉන්දියාවෙ වගේ බහුලව නෑ. නමුත් ඉන්දියාවේ එහෙම නෙමෙයි. බ්‍රාහමණ දෘෂ්ඨිය, බ්‍රාහ්මණ ධර්මය, වේදය, ආත්මවාදී ඇදහිලි ආදී නොයෙකුත් දේ තිබෙනවා. බුදුරජාණන්වහන්සේගේ කාලයේම හිටියා ප්‍රසිද්ධ ශාස්තෲන්වහන්සේලා 6 දෙනෙක් ෂඩ්ශාස්තෲන් වහන්සේලා කියලා. ඒ ෂඩ්ශාස්තෲන් වහන්සේලාගේ ගෝල බාලයොත් ඉන්නවා. දවසින් දවස තව තවත් දෘෂ්ඨි බිහි වෙනවා. එහෙම පරිසරයක තමයි බුදුරජාණන්වහන්සේගේ ධර්මය මතුවෙන්නේ. එතකොට බුදුරජාණන්වහන්සේ පිරිනිවන්පාල මාස තුනකින් ධර්මය සජ්ඣායනා කරනවා. තවත් අවුරුදු 100 යනකොට නැවතත් දෘෂ්ඨි එකතුවෙනවා මේකට. මහණවෙන අයත් ඔක්කොම එන්නේ අර පරිසරයෙන්. ඔක්කොම ශ්‍රද්ධාවෙන් මහණවෙන අය නොවෙයි. සමහරු පරික්ෂා කරන්න මහණ වෙනවා, සමහර අය කන්න මහණ වෙනවා, සමහරු ජීවනෝපායට මහණ වෙනවා. සමහරු නිවන් දකින්න මහණ වෙනවා. සමහරු නැදෑකම් නිසා හිතවත් කමට මහණ වෙනවා. ඔහොම නොයෙක් ආකාරයෙන් මහණ වෙනවා.

අවුරුදු 100 ක් විතර යනකොට බුදුරජාණන්වහන්සේ දේශනා නොකලපු කරුණු 10 ක් විතර ධර්මයට එක්කාසු කළා, දස වස්තුවක් කියලා. ඊට පස්සේ කාලඅසෝක කියන රජ්ජුරුවන්ගේ කාලේ රේවත මහ රහතන්වහන්සේගේ මූලිකත්වයෙන් විසාලා මහා නුවර වාලුකාරාමයේදී දෙවෙනි ධර්ම සජ්ඣායනාවක් කළා. ඒ ධර්ම සජ්ඣායනාවෙනුත් ස්ථිර කළේ පෙර සජ්ඣායනා කළ ධර්මයමයි. වෙන ඒවා එකතුවෙන්න නොදී ඒ ධර්මය රැක ගත්තා. උන්වහන්සේලා පළවෙනි සජ්ඣායනාවට විරුද්ධව ගියේ නෑ. ඒ ටිකම ආරක්ෂා කරලා අනිත් ඒවාගේ විස්තර කථනයක් පමණක් කරලා තිබෙනවා. මේ දෙවෙනි සජ්ඣායනාව අවුරදු 100 කට පස්සේ සිද්ධ වෙන්නේ. එතනදිත් ත්‍රිපිටකධාරී රහතන්වහන්සේලා 700 නමක් සහභාගි වුනා. ඒක නිසා ඒකට කියනවා **'සත්ත සතික සජ්ඣායනාව'** කියලා. ඉතිං

අදත් අපි ගරු කරන්න ඕනෑ, නමදින්න ඕනෑ, උන්වහන්සේලාට ප්‍රණාමය දක්වන්න ඕනෑ. කුමක් නිසාද? උන්වහසේලා මේ ධර්මය ආරක්ෂා කළා. මිත්‍යා දෘෂ්ඨික අදහස් එක්කාසු වෙන්නට නොදී මේවා රැකපු නිසා. උන්වහන්සේලාට 'අර්ථ' 'ධර්ම' 'නිරුක්ති' 'ප්‍රතිභාන' කියන්නාවූ පිළිසිඹියාපත් ඥාන ශක්ති ධර්ම 4 තිබෙනවා. ඒ නිසා බුදුරජාණන්වහන්සේ දේශනා කළ ධර්මය අවුලක් නැතුව තේරුම් ගන්න උන්වහන්සේලාට හැකියාව තිබෙනවා.

ඊළඟට බුදුරජාණන්වහන්සේ පිරිනිවන්පාල අවුරුදු 236 කට ගියාට පස්සේ අසෝක රජ්ජුරුවන්ගේ කාලේ තුන්වෙනි ධර්ම සජ්ඣායනාව සිද්ධ වෙනවා. ඒකට මොග්ගලීපුත්ත තිස්ස මහා රහතන්වහන්සේ ප්‍රධාන කරගෙන රහතන්වහන්සේලා 1000 ක් වඩිනවා. ඒ ත්‍රිපිටකධාරී දහසක් රහතන්වහන්සේලා පාටලීපුත්ත නගරයේ අසෝකාරාමයේ වැඩ ඉඳගෙන උන්වහන්සේලා ධර්මය සජ්ඣායනා කරනවා. එත් උන්වහන්සේලා පළවෙනි දෙවෙනි ධර්ම සජ්ඣායනා වලට විරුද්ධව යන්නේ නෑ. උන්වහන්සේලා ඒ ධර්මය ආරක්ෂා කරගන්නවා. කථාවත්ථුප්‍රකරණය නමින් පරණ ධර්ම නියායකට අනුකූලවය මොග්ගලීපුත්ත තිස්ස ස්වාමීන්වහන්සේ විස්තර කථනයක් කරනවා. අනිත් ටික ඔක්කෝම ආරක්ෂා කරනවා.

මේ ධර්ම සජ්ඣායනා තුනේදීම රහතන්වහන්සේලාගේ ඉදිරිපත්වීම තිබෙනවා. අනිත් එක ඒකාලේ, සූත්‍ර පාඩම් කරලා පුරුදුවෙන්නේ නැතුව උච්චාරණ ශක්තිය හදාගන්නේ නැතුව ධර්මය කියන්න දෙන්නේ නෑ. ඒක ගුරුවරයකුගේ තිබෙන කාර්ය. සූත්‍රයක් උගන්නන්ට ඕනේ, ඒකෙ අර්ථ කථනය කියලදෙන්න ඕනේ, වාක්‍යය කියලාදෙන්ට ඕනේ, වචනවල තේරුම් කියලා දෙන්ට ඕනේ. ඔය විදියට තමයි ඒ කාලේ සූත්‍ර ඉගැන්වීම කරලා තිබෙන්නේ. අද කාලේ වගේ කඩේට ගියා, පොතක් ගත්ත ඊළඟට හිතු මතේට කියන්න අවස්ථාවක් ඒ කාලේ නෑ.

එතකොට තුන්වෙනි ධර්ම සජ්ඣායනාවේදී රහතන්වහන්සේලා දහස් නමක් ඉදිරිපත් වෙනවා. මම පිළිගන්නේ මම ගරු කරන්නේ ඒ ස්වාමීන්වහන්සේලා රැකපු, ඒ ස්වාමීන්වහන්සේලා සජ්ඣායනා කරපු සූත්‍ර සහ ත්‍රිපිටකයයි. පළවෙනි ධර්ම සජ්ඣායනාවේ 500 දෙනා වහන්සේලාටත් දෙවෙනි ධර්ම සජ්ඣායනාවේ 700 දෙනා වහන්සේලාටත් තුන්වෙනි ධර්ම සජ්ඣායනාවේ

1000 ක් දෙනා වහන්සේලාටත් අපි අදත් නමස්කාර කරන්න ඕනෑ. උන්වහන්සේලා තථාගත ධර්මය නිවැරදිව සජ්ඣායනා කළා, පෙලගැස්සෙව්වා කිසිම කෙනෙකුට අතගහන්න අඩුවක් පාඩුවක් තියලා නෑ. අනෙත් එක උන්වහසේලාට භාෂාව පිළිබඳව එහෙම ගැටලුවක් නෑ. ‘අර්ථ’ ‘ධර්ම’ ‘නිරුක්ති’ ‘ප්‍රතිභාන’ කියන පිළිසිඹියාපත් ඥාන ධර්ම තිබෙන නිසා එහෙන් මෙහෙන් කෑලි ගැටගහන්න අවශ්‍ය වෙන්නේ නෑ. ප්‍රතික්ෂේප කළයුතු දේ ධර්මානුකූලව ප්‍රතික්ෂේප කරනවා. ගන්න අවශ්‍ය දේ ධර්මානුකූලව ගන්නවා.

මෙහෙම කාලයක් යනකොට ධර්මාශෝක රජ්ජුරුවන්ගේ කාලේ ඒ සජ්ඣායනා කළාවූ ධර්මයත් අරගෙන තමයි මිහිඳු මහරහතන්වහන්සේ ලංකාවට වැඩම කරන්නේ. බුදුරජාණන්වහන්සේගේ පිරිනිවීමෙන් වසර 250 වගේ කාලේ තමයි උන්වහන්සේ ලංකාවට වැඩලා ලංකාවේ ධර්මය ස්ථාපනය කරන්නේ. ලංකා භූමියේ ධර්මය ස්ථාපනය කරලා ටික කාලයක් යනකොට ලංකාවේ අලුතින් මහණ වෙච්ච ස්වාමීන්වහන්සේලාට හොඳට ධර්මය උගන්නනවා, කියලා දෙනවා.

ඊළඟට බුදුරජාණන්වහන්සේ පිරිනිවන් පාලා අවුරුදු 400 ක් 450 ක් පමණ වෙනකොට ලංකාවට විශාල ඛේදවාචකයක් සිදු වෙනවා. ඒ තමයි බැමිණිටියාසාය ඇතිවෙනවා. මේ කාලයේදී තිරිපිටකධාරී මහ රහතන්වහන්සේලා විශාල ප්‍රමාණයක් පිරිනිවන් පානවා. ඊට පස්සේ මේ ධර්මයට හානියක් සිද්ධ වෙයි කියන අදහස ඇති වෙලා ත්‍රිපිටකධාරී රහතන්වහන්සේලා 500 නමක් එකතුවෙනවා මාතලේ අළු විහාරයට. මාතලේ අළුවිහාරයේදී ක්‍රිස්තු පූර්ව පළවෙනි සියවසේදී එනම් බුදුරජාණන්වහන්සේ පිරිනිවන්පාල අවුරුදු 450 ක් විතර ගියාට පස්සේ තමයි මේක සිද්ධ වෙන්නේ. උන්වහන්සේලා තමයි කටපාඩම් කරගෙන ආපු ඒ ධර්මය පොත් පත්වල එහෙම නැත්නම් පුස්කොළ වල ලියන්නේ. ඒ වෙනකොට උන්වහන්සේලා පොත් වශයෙන් සූත්‍ර වශයෙන් ධර්මය හොඳට පෙළ ගස්සලා කටපාඩම් කරමින් හිතේ දරාගෙන ආව. උන්වහන්සේලා ප්‍රධානවම ඉගෙන ගන්නේ සූත්‍රය. උන්වහන්සේලා සූත්‍ර විනය අභිධර්මය ඉගෙන ගත්තට පස්සේ අලුතෙන් ස්වාමීන්වහන්සේ කෙනෙකුට උගන්නන කොට ඒ සූත්‍ර දේශනාව උගන්නලා, ඒකෙ වචන වල තේරුම් කියලා දෙන්න ඕනේ. ඊළගට ඒවායේ තේරුම්, ඒවා හැදෙන තාලේ, ඒ වචනවල උච්චාරණ විදි සියල්ලම කියලා දෙන්න ඕනේ. එහෙම තමයි උගන්නන්නේ. ඒකට කියනවා ‘වණපොත්’ කරනවා කියලා. පිරුවානා

කියලා කියන්නේ සජ්ඣායනා කිරීම් වශයෙන් පාඩම් කිරීමට. උච්චාරණය හොඳට එනකම්ම මේ විදියට කියලා දෙනවා.

මේ වගේ පළවෙනි ධර්ම සජ්ඣායනාවෙන් ආරක්ෂා කරපු ධර්මය දෙවෙනි සජ්ඣායනාවෙනුත් තහවුරු කළා. තුන්වෙනි සජ්ඣායනාවෙනුත් තහවරු කළා. හතරවෙනි සජ්ඣායනාව සිදුවෙන්නේ අවුරුදු 450 කට විතර පස්සේ ක්‍රිස්තු පූර්ව පළවෙනි සියවසේදි. එතැනදී තමයි ධර්මය පොත් වල ලියවෙන්නේ. ඒක නිසා අදත් අපි ගරුකරනවා නම් ආන්න ඒ මාතලේ අළුවිහාරේ ධර්මය සජ්ඣායනාව සිද්ධ කලා වූ ඒ භික්ෂූන්වහන්සේලාට, රහතන්වහන්සේලාට අපි ගරු කළ යුතුයි, නමස්කාර කළ යුතුයි. ඔය විදියට සජ්ඣායනා 4 ක් තිබෙනවා. අදට ලෝකය පුරාම තිබෙන්නාවූ ඔක්කොම ත්‍රිපිටක මාතලේ අළුවිහාරයේ ලියපු ඒ ත්‍රිපිටකයෙන් විකාශනය වූ ත්‍රිපිටක ධර්මයයි.

අපි හිතන්න හොඳ නෑ ඒ අළුවිහාරයේ ධර්මය ලියනකොට කොට අකුරු දන්නේ නැති ශබ්දය දන්නේ නැති, ඒ වගේම අවරුදු 2500 කට පස්සේ අපිට හරි ගස්සන්න ධර්ම කෑලි ඉතුරු කරලා ගියා කියලා. ඒවා මහ විහිළු කථා. අවුරුදු 2500 කට පස්සේ අපිට හරි ගස්සන්න, වචන හදන්න, උච්චාරණය කරන හැටි ඒ හාමුදුරුවරුන්ට මෙහෙ ඉඳලා උගන්වන ඒවා මහා විහිළුකථා. උන්වහන්සේලා හොඳ උගත් ස්වාමීන්වහන්සේලා. කාටවත් අඩුපාඩු හදන්න ඉතුරුකරලා නෙමෙයි ධර්මය ලිව්වේ.

හොඳට හිතලා බලන්න. යම්කිසි ස්වාමීන්වහන්සේ කෙනෙකුට හිතෙනවා නම් මේ ධර්මය තව ටිකක් කල් යනකොට නැතිවෙනවා, විනාස වෙනවා, ලෝකයෙන් අතුරුදහන් වෙනවා ඒකනිසා ඒ ධර්මය නියම විදියට පොත්වල ලියන්නත් ඕනෑ කියලා, එහෙම නම් අකුරු වැරදියට ලියනවද? ඔච්චර ලොකු හැඟීමක්, ඔච්චර ලොකු අදහසක් එනවනම් අකුරු දන්නේ නැති අය දා ගන්නවද ඕකට. එහෙම වෙයිද?

භාෂාවක තිබෙන උච්චාරණය තිබෙන්නේ කටට. නියම වචන තිබෙන්නේ අපේ ශබ්දයේ. ඒක රහසක් නෙමෙයි. අද කාලේ භාෂාව දන්න අයගෙන් ගිහිල්ලා ඕක ඉගෙන ගන්න ඕනේ නෑ. පොඩි කාලේදීම ‘සකස්කඩේ’ එහෙම කියවන කොට කඩපාඩමෙන් කියන්නේ. ස්ලෝක පොත් කියල

දෙනවා. ඒවා හඬින්නේ කියලා දෙන්නේ. අකුරු කියවලා නෙමෙයි. දැන් හිතන්න පොඩි කාලේදි තියෙනවා නේද nursery rhymes. ඒවා පොඩි ළමයින්ට කියලා දෙන්නේ අකුරු ලියලද? නෑ, ශබ්දයෙන් කියලා දෙන්නේ. එතකොට ශබ්දයෙන් එයා ග්‍රහණය කර ගන්නවා. ඒවගේ තමයි ඒ කාලේ තිබුණේ.

අකුරු වර්ග දෙකක් තිබෙනවා. එකක් තමයි 'ශබ්ද අක්ෂරය'. අනිත් එක තමයි 'රූප අක්ෂරය'. ශබ්ද අක්ෂරය කියලා කියන්නේ අක්ෂරය ශබ්ද කරලා පෙන්නන එකට. ඒ ශබ්ද කරලා පෙන්නන අක්ෂරයට රූපය මේකයි කියලා ලියලා පෙන්නනවා. ඒකට කියනවා රූප අක්ෂරය කියලා. අපි ලියන **'අ' 'ඇ'** කියන අකුරු 'අක්ෂර රූප'. පිරිත් කියන්න ඕන වෙන්නේ ශබ්ද අක්ෂරයද රූප අක්ෂරයද? පිරිත් කියන්න ඕනේ වෙන්නේ 'ශබ්ද අක්ෂරයයි'. පිරිත් පොත ලියන්න ඕනෙ වෙන්නේ 'රූප අක්ෂරයයි'. ඒක නිසා රූපය දැක්කයින් පස්සේ ඒකෙ තිබෙන ශබ්දය මේකයි කියලා අපිට දැනුමක් තේරුමක් තියෙන්න ඕනේ. එතකොට මේ ටික දන්නේ නැති රහතන්වහන්සේලාද ඔය ධර්ම සජ්ඣායනාව කළේ? නැනේ. මේකේ භයානකත්වය හොඳටම ඒ රහතන්වහන්සේලා දන්නවා.

අනිත් එක තමයි මේවට මහප්‍රාණ ශබ්ද තිබෙනවා අල්ප ප්‍රාණ ශබ්ද තිබෙනවා. මහප්‍රාණ ශබ්දයකට දාන්න ඕන රූපක උන්වහන්සේලා හඳුනාගෙන තිබෙනවා. අල්ප ප්‍රාණ ශබ්දයකට දාන්න ඕන රූපකය මේකයි කියලා උන්වහන්සේලා දැනගෙන තිබෙනවා. ඒ රූපකය පෙන්නලා තමයි ඊට පස්සේ උච්චාරණය කියලා දෙන්නේ. රූප අක්ෂරයෙන් විතරක් ශබ්දය දැනගන්න බෑ. මොකක්ද කරන්න ඕනේ වෙන්නේ? උච්චාරණය දැනගන්න ඕනේ. දැන් සමහර වෙලාවට ත්‍රිපිටක පොතක් සල්ලි වලට ගන්න පුළුවන්. අකුරුත් තේරෙනවා නමුත් උච්චාරණය කවුද දෙන්නේ සල්ලි වලට? ඔය සමහර තැන්වල ගාථා කියන්නෙත් වැරදියට. පිරිත් කියන්නෙත් වැරදියට. වචන හසුරුවන්නෙත් වැරදියට. ඇයි ඒ? උච්චාරණය ඉගෙනගෙන නෑ. ඔන්න ඔය විදියට බණ කියන්න ගියහම සහ ධර්මය තේරුම් කරන්න ගියැන් පස්සේ අනාගතේ ධර්මය නැති වෙනවා.

අපේ මට්ටමට මෙච්චර තේරෙනවා නම් අනාගතේ දකින්නාවූ, බුදුරජාණන්වහන්සේගේ ත්‍රිපිටක ධර්මය දකින්නාවූ හිතක් තිබෙන රහතන් වහන්සේලාට ඕක තේරුණේ නැත්ද? එහෙම හිතනවා නම් තේරුණේ නෑ

කියලා ඒක කාගේ වරදක්ද? අපේම තිබෙන්නාවූ මෝඩ කමක් ඇරෙන්න වෙන මොකක්වත් නම් නෙමෙයි.

හතරවෙනි ධර්ම සජ්ඣායනාවෙදී ඇයි තල්පත් හොයා ගත්තේ? හොඳට හිතලා බලන්න. තල්පත කලක් පවතිනවා. තල්පත් හදන තාලේ දන්නවද? තල්පත් තම්බලා ඊට පස්සේ පවනේ වේලලා මදිනවා. මැදලා දොරණතෙල් කියලා තෙලක් ගානවා. මේ තෙල සිංහරාජ කැළේ තිබෙන ගස් ජාතිකයකින් ගන්නේ. මේ තෙල් ගැවහම සත්තු විදින්නේ නෑ. ඊට පස්සේ එහෙම මැද ගත්තු තල්පත් වල අකුරු ලියන්නේ කට්ටකින්. කට්ටකින් අකුර ලියාගෙන ගිහිල්ලා ඊට පස්සේ විශේෂ අගුරු ජාතියකින් මදිනවා. එතකොට අර කැපිච්ච තැන කලුපාටින් පිරිලා යනවා. නැවතත් තෙල් මැදපු ගමන්ම ඉතාම හොඳට අකුර පේනවා. ඔච්චර හරියක් කරන්න පුළුවන් රහතන්වහන්සේලා, ඔය කොළේ කල් පවතිනවා කියලා දැනගන්න පුළුවන් රහතන්වහන්සේලා, ඔය අඟුරු මදින වැඩේ කරන්න පුළුවන් රහතන්වහන්සේලා, තල්පත් තෝරාගන්න පුළුවන් රහතන්වහන්සේලා **'අ' 'ආ' 'ඇ'** දන්නේ නැත්ද? හිතලා බලන්න. **'හ' 'ග'** තේරෙන්නේ නැත්ද? එහෙම හිතෙනවද? ඔච්චර දෙයක් දන්නේ නැතුවද මේ වැඩේට බැස්සේ? ඒක නිසා අතීතයට ව්‍යාකරණ උගන්නන්ට කලියෙන් අපිට ඒ ස්වාමීන්වහන්සේලා දීපු ටික ගැන හිතන්න ඕනේ. අපි සමහර වෙලාවට යන්නේ අතීතයට උගන්නන්න. එහෙම අය ඉන්නවා.

මගෙන් දොස්තර මහත්තයෙක් සූත්‍ර ඉගෙන ගත්තා. ඒ මහත්තය මැරුණා. ඒ මහත්තයට සමාජයේ කැපී පෙන්න කැමතියි. ඉතිං ඒ මහත්තය බෞද්ධ සභා වලට යනවා. ඒ බෞද්ධ සභාවලට ගියහම වෛද්‍ය වරයෙක් හැටියට ගණන් ගන්නවා. ධර්මය දන්නා කෙනෙක් හැටියට ගණන් ගන්නේ නෑ. එහෙම වෙනවනේ. හැබැයි වෛද්‍ය වරයෙක් හැටියට ගණන් ගත්තට මේ සභාවට වැඩක් නෑ. නන්දදාස කෝදාගොඩ මහත්තයා හිටියා. ඒ මහත්තයා හැමතැනම කැපී පේනවා. ඇයි ඒ? ඒ මහත්තය පොත පතත් කියනවා, සමාජ ආචාරසීලි දේවලුත් දන්නවා. announce කරනවා, වෙදකමත් දන්නවා. ඒක නිසා ඒ මහත්තයා යම්කිසි තැනකට ගියැන් පස්සේ හරියට පිළිගන්නවා. ඒ හින්දවත්ද දන්නේ නෑ මේ මහත්තයත් ඇවිල්ලා එක එක පොත පත ඉගෙන ගත්තා, සාකච්ඡා කළා. හැබැයි පස්සේ මට කිව්වා ස්වාමීන්වහන්ස, මට පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලයේ උපාධිය කරන්න ඕනේ කියලා. මම කිව්වා මට පුළුවන් හැටියට මම උදව් කරන්නම් කියලා. ස්වාමීන්වහන්සේටත් මම registration දාන්නම් කියලත් කිව්වා. මම කිව්වා

මට එපා මට අවශ්‍ය නෑ, මහත්තයට මම උදව් කරන්නම්, මහත්තය ලියන්න කියලා. මට නැවත නැවත කිව්වා මට පොතුත් ගෙනත් දෙන්නම්, ගෙනිහිල්ලා බස්සන්නම්, උදව් කරන්නම් කියලා. මම කිව්වා මට එපා ඔබ තුමා ගිහිල්ලා ඉගෙන ගන්න කියලා. ඒ කාලේ හිටියා Y. කරුණාදාස කියලා අභිධර්ම පිළිබඳව මහාචාර්යවරයෙක්. Y. කරුණාදාස මහත්තය උදව් කරගෙන මේ දොස්තර මහත්තය ලිව්වා. ලිව්වේ මොකක්ද? විනය පිළිබඳව. පාස්උනා. MA එකකුත් කළා. ඒ මහත්තය මට වඩා ගොඩක් වැඩුමල්. මම බොහොම බාලයි. ඒත් ඒ මහත්තයා මම මග පෙන්නුවා කියලා, මට උපහාරයක් වශයෙන් පිළිගන්නවා කියලා ඒ පොත මට ගෙන්නල්ලා පූජා කළා. හැබැයි ප්‍රශ්නයක් හිටියා. ඒ තත්වයට පත් උනාට පස්සේ ඒ මහත්තයත් අතීතයට උගන්නන්නයි ගියේ. මම ඇහුව මහත්තය දැන් ඉගෙන ගත්තේ නිවන් දකින්නද අතීතයට විනය උගන්නන්ද කියලා. ඉස්සෙල්ලාම කිව්වේ මම යම් කිසි තැනකට ගියැත් පස්සේ උපාධියක් එහෙම නැත්නම් අපිව ගණන් ගන්නේ නෑ කියලා. ඒ මහත්තය ඇත්තම කිව්වා. විශේෂඥ වෛද්‍යවරයෙක්. විශේෂඥ වෛද්‍යවරයෙක් උනාට එයාව ගණන් ගන්නේ නෑ කියලා කිව්වා. හේතුව, එයා ධර්ම මණ්ඩලයේ විශේෂඥයෙක් නොවෙන නිසා. ඉතින් අර තත්වය ගත්තයින් පස්සේ එයාට කථා කරන්න පුළුවන්. එතකොට ඒ කථා කරන දේ අනිත් අය පිළිගන්නවා.

ඒක නිසා අතීතයේ ඉතුරු කරපු දෙයින් අපි පරෙස්සමෙන් ධර්මය ඉගෙන ගන්න ඕනෑ. අතීතයේ වැරදි හදන්ට යන්න හොඳ නෑ. දැන් අපි ධර්ම සජ්ඣායනා 4 ක් කිව්වා. ඊට පසු කාලීනවත් ධර්ම සාකච්ඡාවක් පවත්වල තිබෙනවා බුරුම රටේ, මණ්ඩලේ නුවර 1871. ඒක ඒ තරම්ම ප්‍රසිද්ධ නෑ, හේතුව, ලෝකයේම භික්ෂූන් වහන්සේලා එකතුකරගෙන නෙමෙයි කරලා තිබෙන්නේ. ඒක ඒ රටේම ස්වාමීන්වහන්සේලා තිබිච්ච එකම තහවරු කරගෙන තිබෙනවා. ඊළඟට තව ධර්ම සජ්ඣායනාවක් පැවැත්තුවා 1956 බුරුම රටේ රැන්ගුන් නුවර. ඒ තමයි ‘ඡට්ඨ සංගායනාව’. සජ්ඣායනාවල් කරලා තිබෙන්නේ 6 යි. හැබැයි ඒකෙන් 5 ක් ප්‍රසිද්ධයි එකක් අප්‍රසිද්ධයි. පළවෙනි, දෙවෙනි, තුන්වෙනි, හතරවෙනි, සයවෙනි සජ්ඣායනාවල් ප්‍රසිද්ධයි. පස් වෙනි එක අප්‍රසිද්ධයි.

ඔන්න ඔය සජ්ඣායනාවලට සහභාගී වෙච්ච ස්වාමීන්වහන්සේලා රැකපු, ඒ ස්වාමීන්වහන්සේලා දේශනා කරපු, පෙළ ගස්සපු සූත්‍ර විනය සහ අභිධර්ම දේශනාවල් තමයි මම භික්ෂූන්වහන්සේ නමක් හැටියට පිළිගන්නේ, ඉගෙන ගන්නේ, අදහන්නේ, භාරගන්නේ, කියවන්නේ සහ උගන්නන්නේ. අනිත් දේවල් වලට මම අතගහන්නේ නෑ. එහෙම තියෙනවා නම් වෙන කිසි

දෙයක් මම උගන්නන්නේ නෑ. හේතුව, ඒ ස්වාමීන්වහන්සේලා ධර්මය උගන්නන කොට බුද්ධකාලේ ඉඳලම සූත්‍රය සහ අර්ථකතනය වශයෙන් ඉගැන්නුවේ. **'අට්ඨකථා'** කියන්නේ ඒකයි. පස්සේ සිංහලට පෙරලන කොට 'අටුවා' කියලා කියනවා. දැන් අර්ථකතනයක් නැතුව යමක් කියන්න පුලුවන්ද? දැන් බලන්න IT කියලා වචනයක් තිබෙනවා. IT කියන එකේ මොකක්ද අර්ථකතනය? Information technology. දැන් බලන්න, ඒකටත් අටුවාවක් තියෙනවනේ. ඊට පස්සේ Information කියන්නේ මොකක්ද කියලා අහනවා. Information කියන්නේ මොකක්ද? තෙරතුරු. ඒ කියන්නේ යම්කිසි සිද්ධියක විස්තරයක්. Technology කියලා කියන්නේ මොකක්ද? ඒ තොරතුරු ලබා ගන්න තාක්ෂණය. ඒකටත් අටුවාවක් තිබෙනවා. ඕක දන්නේ නැතුව IT කියන වචනයෙන් විතරක් තේරුම් ගන්න පුලුවන්ද? තුනපහ කියන්නේ මොකක්ද? ඒකෙ අර්ථකතාව දැනගන්න ඕනේ. සැවැත්නුවර කියලා කිව්වොත් සැවැත්නුවර කියන්නේ ඇයි කියලා තේරුමක් තියෙන්න ඕනේ. **'සබ්බං අත්ථීති වා සාවත්ථි'** = සියලුමදේ ඇති නිසා සැවැත්නුවර කියනවා. දැන් ඉගෙන ගන්න තුනපහ කියන එකේ අටුවාව මොකක්ද කියලා. IT කියන එක මොකක්ද කියලා තෙරුම් ගන්න. **'ඒවං'** කියලා වචනයක් තිබුනොත් එහෙම **'එවං'** කියන්නේ ඇයි? තේරුම දන්නේ නැතුව නිකම්ම **'ඒවං'** කියලා කිව්වට හරියනවද? සිංගප්පූරුව කියන එකේ තේරුම මොකක්ද? සිංහපුර කියන එක. සිංහයෝ ඉඳලා තියෙනවා කොහේ හරි කැලේක. සිංහපුර තමයි පස්සේ සිංගප්පූරුව උනේ. අන්න ඒ වගේ යම්කිසි වචයක් හැදෙන්න ආපු අර්ථාන්විත තේරුම, ඒකට දෙන නිරුක්තිය දැන ගන්න ඕනේ. ඒවත් එක්ක තමයි ඒ රහතන්වහන්සේලා ඉස්සර ගෝලයන්ට ඉගැන්නුවේ. ඒ තේරුමට කියනවා **'අර්ථය'** උගන්වනවයි කියලා. ඒවගේ අර්ථය උගන්නපු, තේරුම් උගන්නපු, **'මහා අර්ථකථනය'** කියලා එකක් තිබෙනවා. ඒකට කියනවා **'මහා අට්ඨකථාව'** කියලා. ඉන්දියාවේ ප්‍රසිද්ධ **'මහා අට්ඨකථාව'**. යම්කිසි කෙනෙක් සූත්‍රයක් ඉගෙන ගත්තනම් එයා ඒකෙ මහා අර්ථකථනයත් දැනගත යුතුයි. නැත්නම් එයාට ඒක හසුරුවන්න බෑ. වචන දන්නේ නෑ. වචන ටිකක් කියන්න පුළුවන්, නමුත් ඒකෙ තේරුම් දෙන්න දන්නේ නෑ. ඒක නිසා තමයි ඔය අර්ථකථනය වෙනම ලිව්වේ. 'මහා අට්ඨකථා', 'පච්චරිය අට්ඨකථා', 'කුරුන්දි අට්ඨකථා', 'අන්ධකට්ඨ කථා', 'සංඛෙපට්ඨ කථා' යනුවෙන් ප්‍රධාන අට්ඨකථා පහක් තිබෙනවා. ඒකෙන් 'මහා අට්ඨකථාව' තමයි මිහිඳු මහ රහතන්වහන්සේ පාවිච්චි කරලා තිබෙන්නේ. ඒකෙ ආපු ඒවා තමයි හැම වෙලාවේම බුද්ධඝෝෂ හාමුදුරුවොත් පරිහරණය කරලා තිබෙන්නේ. ඒවා පසු කාලීනව සිංහලෙන් ලියලා තිබිලා තියෙනවා. සූත්‍ර සියල්ල තිබුණේ පාලියෙන්. ශ්‍රී ලංකාවේ භික්ෂූන් වහන්සේලාට සිංහලෙන් අර්ථකථනය කියලා දුන්නා.

අනිත් කාරණාව තමයි, බුද්ධඝෝෂ හාමුදුරුවෝ අටුවා ලියපු භික්ෂූන්වහන්සේ කෙනෙක් නෙමෙයි. ඒ කථාවත් සම්පූර්ණ වැරදියි. බුද්ධඝෝෂ හාමුදුරුවෝ පරිවර්තකයෙක්. සිංහල භාෂාවෙන් තිබිච්ච දේවල් පාලි භාෂාවට පරිවර්තනය කළා. නමුත් ඒ හාමුදුරුවෝ ඔක්කොම පරිවර්තනය කළේ නෑ. ඔක්කොම පරිවර්තනය කරන්න බෑ. තවත් හාමුදුරුවරු හිටියා පස් දෙනෙක් විතර සම්බන්ධ වෙච්ච. වනරතන කියලා ස්වාමීන්වහන්සේ කෙනෙක් ඉන්නවා, ධම්මපාල කියලා ස්වාමීන්වහන්සේ කෙනෙක් ඉන්නවා. එක කාලයක පොත් කීපයකට විතරක් ප්‍රධානත්වය දැරුවා බුද්ධඝෝෂ ස්වාමීන්වහන්සේ. බුද්ධඝෝෂ ස්වාමීන්වහන්සේ රහතන්වහන්සේ නමක් නෙමෙයි. ඒ ස්වාමීන්වහන්සේ ධර්මය හොඳට උගත්, භාෂාව හොඳට උගත් ස්වාමීන්වහන්සේ නමක්. ඒ ස්වාමීන්වහන්සේට පරිවර්තනය කිරීමේ හැකියාව තිබෙනවා. 'විසුද්ධි මාර්ගය' කියන පොත ලියවෙන්න ඉස්සෙල්ලා රහතන්වහන්සේ කෙනෙක් විසින් භවනා ක්‍රම සම්බන්ධයෙන් සකස් කරන ලද අත්පොතක් (manual) තිබිලා තියෙනවා **'විමුක්ති මාර්ගය'** කියලා. ඒ විමුක්ති මාර්ගය දිහා බලාගෙන, ඒ සටහනේ හැටියට තමයි බුද්ධඝෝෂ හාමුදුරුවෝ 'විසුද්ධි මාර්ගය' ලියලා තිබෙන්නේ. හැබැයි එහෙම සඳහනක් ඒ ස්වාමීන්වහන්සේ ඒකෙ කරලා නෑ. ඒ 'විමුක්ති මාර්ගයේ' හැඩරුව තමයි 'විසුද්ධි මාර්ගයේ' තිබෙන්නේ.

<u>ප්‍රශ්නයක්</u> - එතකොට විමුක්ති මාර්ගය සිංහලෙන්ද ලියලා තිබුණේ.

<u>පිළිතුර</u> - නෑ, පාලියෙන්. ත්‍රිපිටකය සම්පූර්ණයෙන්ම තිබුණේ පාලියෙන්. බුදුරජාණන්වහන්සේගේ නියම දේශනාව සම්පූර්ණයෙන්ම තිබුණේ පාලියෙන්. සූත්‍ර, විනය, අභිධර්මය යන තුනම තිබුණේ පාලි භාෂාවෙන්. ඒ කියන්නේ මාගධී භාෂාවෙන්. හැබැයි අටුවාවල් තිබුණේ සිංහල භාෂාවෙන්. හේතුව, සිංහල හමුදුරුවරුනේ ඉන්නේ ලංකාවේ. ඒ හාමුදුරුවරු පාලිය ඉගෙන ගන්නවා, ඒවායේ තේරුම් සිංහලෙන් දැනගන්නවා. ඇත්තටම ලංකාවේ හාමුදුරුවරුන්ට අර්ථකථනය තිබෙන්න ඕනේ සිංහලෙන්නේ. හැබැයි ඒකෙ අවාසියක් තිබෙනවා පිටින් එක කෙනෙකුට. හොඳටම ත්‍රිපිටක ධර්මය පරිපූර්ණව තිබෙනවා ලංකාවේ. ඒවගේම අර්ථකථනයත් තිබෙනවා ලංකාවේ. හැබැයි පිටින් ආපු එක්කෙනෙක් ඉගෙන ගන්නවා නම් භාෂා දෙකක් ඉගෙන ගන්න ඕනේ. පාලි ඉගෙන ගන්න ඕනේ සූත්‍ර විනය ආදී දේවල් ඉගෙන ගන්න. සිංහල ඉගෙන ගන්න ඕනේ ඒකෙ තේරුම් දැන ගන්න. ඒ ප්‍රයෝජනය සලකාගෙන තමයි බුදුරජාණන්වහන්සේගේ දේශයේ දේශනා කරපු මව් භාෂාව හැටියට සලකලා ඒක පාලි භාෂාවට පරිවර්තය

කරලා තිබෙන්නේ. අටුවා පරිවර්තනය කළා මිසක පෙළ දහම පරිවර්තනය කරන්න ඉඩ දීලා නැහැ. එහෙම කරන්න ගියෙත් නෑ.

දැන් මේක සාරාංශයක්. ඒක නිසා අපි ගරු කලයුතු වෙන්නේ, අපි පිළිගත යුතු වෙන්නේ පළවෙනි ධර්ම සජ්ඣායනාවෙන්, දෙවෙනි ධර්ම සජ්ඣායනාවෙන්, තුන්වෙනි ධර්ම සජ්ඣායනාවෙන්, හතරවෙනි මාතලේ ධර්ම සජ්ඣායනාවෙන් පැවතෙන්නාවූ ධර්මයටයි. ඒවාගේම උන්වහන්සේලා අපිට වඩා හොඳට හිතලා තිබෙනවා. අපි හිතන්න පටන් අරගෙනවත් නෑ. ඒ විදියට හිතලා පරෙස්සම් ඇතුව මේ ධර්මය රැකගෙන ආව අපේ ස්වාමීන්වහන්සේලා. අපිට අද මේ කථා කරන්න print කරන්න තිබෙන්නේ ඒ ස්වාමීන්වහන්සේලා ධර්මය රැකපු නිසා. නැත්නම් එහෙම ඔය සිංහ හඬවල් පවත්වන්න බැහැ.

ඒ රහතන්වහන්සේලාගෙන් පැවත එන, ඒ රහතන්වහන්සේලා රැකපු, ඒ රහතන්වහන්සේලා සජ්ඣායනා කරපු, මාතලේ අලුවිහාරයේදී ලියපු, ඒ ත්‍රිපිටකයේ තිබෙන්නාවූ සූත්‍ර දේශනාවක් තමයි අද අපි සාකච්ඡා කරන්න ඉදිරිපත් කර ගන්නේ. දැන් මේ සූත්‍ර වලට 2500 බුද්ධ ජයන්තියට බලංගොඩ ආනන්දමෛත්‍රිය හාමුදුරුවෝ ඇතුළු තවත් උගත්, සාසනයට කැපවී වැඩ කරන බොහෝ ස්වාමීන්වහන්සේලා අර පුස්කොළ පොත්වල තිබෙන්නාවූ සූත්‍ර අරගෙන ඒවා සිංහල භාෂාවට පරිවර්තනය කරලා කොළවල අච්චු ගහන තත්වයට සංසෝධනය කරලා දුන්නා. මේ ක්‍රියාවට කාර්ය මණ්ඩලය ගොඩක් ඉඳල තිබෙනවා. ඒ ස්වාමීන්වහන්සේලා වැඩ හිටපු 'මහනායක චාරිකාරාමය' නමින් සංඝාවාසයක් විජේරාම මාවතේ තිබෙනවා. පරවාහැර පඤ්ඤානන්ද ස්වාමීන්වහන්සේ, ලබුගම ලංකානන්ද ස්වාමීන්වහන්සේ, බලංගොඩ ආනන්දමෛත්‍රිය ස්වාමීන්වහන්සේ වගේ ගොඩක් උගත් ස්වාමීන්වහන්සේලා තමයි ඔය වැඩේට සම්බන්ධ උනේ. ඒ ස්වාමීන්වහන්සේලා තමයි මේ පරිවර්තනය කරලා තිබෙන්නේ. සිංහල පරිවර්තනය ගත්තම එක එක ස්වාමීන්වහන්සේලාගේ භාෂා දැනුම අනුව වචන වෙනස්. බුද්ධ ජයන්ති ත්‍රිපිටකය ගත්තහම වම් පැත්තේ පිටුවේ තිබෙන්නේ බුදුරජාණන්වහ්සේගේ කාලේ ඉඳලාම ආරක්ෂා කරගෙන ආපු ඒ ත්‍රිපිටක ධර්මය, ඒ සූත්‍ර දේශනාවල් රූපක අක්ෂර වලින් තිබෙන්නේ. කටහඬක් නැනේ පොතේ. ඒ රූප අකුරු වලින් කියවෙන්නාවූ ශබ්දය අපිට වෙනම ඉගෙන ගන්න ඕනෑ. ඒකට ගුරුවරයෙක් අවශ්‍යයයි. අපිට පොඩි කාලේ ඉඳලම උගන්නව පාලි. පාලි භාෂාවත් සිංහල භාෂාවත් ඉතාමත් ළඟ තිබෙන භාෂාවල් නිසා අපිට ඒක ප්‍රශ්නයක් නෑ. සිංහල අකුරු වලින් තමයි පාලිය තිබෙන්නේ. පාලි භාෂාවට ජාතියක් නෑ. පාලි භාෂාවට අකුරකුත් නෑ. පාලි ශබ්දය අපිට ඉංග්‍රීසි භාෂාවෙන් ලියන්න පුළුවන්. දේවනාගරී හෙවත්

හින්දි භාෂාවෙන් වලින් ලියන්න පුළුවන්, සිංහල භාෂාවෙන් ලියන්න පුළුවන්. ඒවා ඔක්කොම දේවල් දැනගෙන තමයි ස්වාමීන්වහන්සේලා අලුවිහාරයේදී ධර්මය ලියලා තිබෙන්නේ. අපිට ඒ ස්වාමීන්වහන්සේලාට භාෂාව උගන්නන්ට අවශ්‍යය නෑ. උන්වහන්සේලා අපිට කියලා දීපු දේ අපි නිවැරදිව ඉගෙන ගන්න ඕනෑ.

මම මේ කියන කථාව ඇත්තද බොරුද කියලා බලන්න පුළුවන් ගෙවල්වල. දැන් ළමයි ඉස්කෝලේ යනවනේ, ගිහිල්ලා ඒ ගොල්ලෝ වචන ටිකක් ඉගෙන අවහම දෙමව්පියන්ට කොලොප්පම් කරනවා. එක මහත්තයෙක් මට කිව්වා ඒ මහත්තයාගේ ළමයි කියන්නනේ ඒ ගොල්ලන්ට ගෝවා ඔළු තියෙන අය කියලලු. (Cabbage headed men) ඇයි එහෙම කියන්නේ? ඇතුලේ මොකුත් නෑ කියන එක. එහෙම කියන්න හේතුව ඒ ළමයින්ට තිබෙනවා මාන්නය කියන එක. මාන්න තිබෙනවා 9ක්. මේ ප්‍රායෝගික ජීවිතේ ගත්තම 'ආරෝග්‍ය මදය' කියලා එකක් තිබෙනවා. 'තරුණ මදය' කියලා එකක් තිබෙනවා. ළමයින්ට ඇතිවෙනවා 'යෞවන මදය' කියන එක. ඒක ආවට පස්සේ අනිත් අය කියන දේවල් අහන්නේ නෑ. ගණන් ගන්නේ නෑ, 'උගත් මදේ' එනවා. මේවා ඔක්කොම මාන්නය. ඕවා ගෙවල් දොරවල් වලින් දැනගන්න පුළුවන්. හොඳයි අපි දැන් මේ සූත්‍ර දේශනාව ඉගෙන ගනිමු.

## ප්‍රථම උරුවෙල සූත්‍රය

**එවං මෙ සුතං – එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි – ''භික්ඛවො''ති. ''භදන්තෙ''ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච –**

සිංහල අර්ථය

'එක් සමයක මවිසින් මෙසේ අසන ලදී'. (මෙසේ කියන්නේ පළවෙනි ධර්ම සජ්ඣායනාවේදී ආනන්ද ස්වාමීන්වහන්සේ). එක් සමයක භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ අනාතපිණ්ඩික සිටුවරයාගේ ආරාමයේ වැඩ සිටින සිටින කාලයෙහි භික්ෂූන් වහන්සේලාට 'මහණෙනි' කියලා ආමන්ත්‍රණය කරනවා. ඒ කාලේ භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට

ආමන්ත්‍රණයකරන්නේ **'භදන්ත'** කියලා. ඒකෙ තේරුම **'පිංවතුන් වහන්ස'** කියන එකයි. ඒ භික්ෂූන් වහන්සේලා බුදුරජාණන්වහන්සේට **'පිංවතුන් වහන්ස'** කියලා උත්තර දෙනවා. බුදුරජාණන්වහන්සේ මේ විදියට ධර්මය කියලා දෙනවා. **'එතදවොච'** කියන්නේ **'එතං අවොච'** කියන එකයි = **'මෙසේ කිවේය'**. ඊට පස්සේ බුදුරජාණන්වහන්සේ භික්ෂූන්වහන්සේලාට ධර්මය දේශනා කරනවා.

හොඳට මේ සූත්‍රය ඉගෙන ගන්න. පස්සේ මම අහන ප්‍රශ්නවලටත් පිළිතුරු දෙන්න. එතකොට මේ පිංවතුන්ට පිහිටක් වේවි. මේක බුදුරජාණන්වහන්සේ දේශනා කරපු කාරණයක්. රහතන්වහන්සේලා රැකගෙන ඇවිල්ලා පොතක ලියලා අපිට දැන් ඉතුරුවෙලා තිබෙනවා.

**''එකමිදාහං, භික්ඛවෙ, සමයං උරුවෙලායං විහරාමි නජ්ජා නෙරඤ්ජරාය තීරෙ අජපාලනිග්‍රොධෙ පඨමාභිසම්බුද්ධො. තස්ස මය්හං, භික්ඛවෙ, රහොගතස්ස පටිසල්ලීනස්ස එවං චෙතසො පරිවිතක්කො උදපාදි – 'දුක්ඛං ඛො අගාරවො විහරති අප්පතිස්සො. කිං නු ඛො අහං සමණං වා බ්‍රාහ්මණං වා සක්කත්වා ගරුං කත්වා උපනිස්සාය විහරෙය්‍ය'''න්ති?**

<u>සිංහල අර්ථය</u>

මහණෙනි මම එක කාලයක උරුවෙලාවේ නේරංජනා නදී තීරය අසල අජපාල නුගගහ යට වැඩ සිටියෙමි. **පඨමාභිසම්බුද්ධො** = බුද්ධත්වයට පත් වූ මුල් කාලයේදී. දැන් බලන්න මේ සිද්ධිය කියන්න ඉස්සෙල්ලා උන්වහන්සේ වැඩ හිටපු තැනත් කියනව. එහෙම කියලා ඊළඟට දේශනා කරනවා ''එහෙම හුදකලාව විවේකීව ඉන්න මට මෙන්න මේ විදියට හිතට කල්පනාවක් ඇති උනා. 'කාට හරි ගෞරවයක් කරන්න නැතුව, පිළිවෙතක් දකවන්න නැතුව, කාටවත් වැඳීමක් පිදීමක් කරන්නේ නැති කෙනෙක් හැටියට ඉන්නවා කියන එක දුකක්. මට කවුරුහරි ශ්‍රමණයන් වහන්සේ නමක් හෝ වේවා බ්‍රහමණයෙක් හෝ වේවා කෙනෙකුට ගරු කරලා වන්දනාවක් කරලා සත්කාර සම්මාන ඇතුව ඉන්න තිබෙනවා නම් කොච්චර හොඳයිද?'' කියලා උන්වහන්සේට කල්පනා උනා.

**"තස්ස මය්හං, භික්ඛවෙ, එතදහොසි – අපරිපූරස්ස ඛො අහං සීලක්ඛන්ධස්ස පාරිපූරියා අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා සක්කත්වා ගරුං කත්වා උපනිස්සාය විහරෙය්‍යං. න ඛො පනාහං පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා අත්තනා සීලසම්පන්නතරං, යමහං සක්කත්වා ගරුං කත්වා උපනිස්සාය විහරෙය්‍යං.**

<u>සිංහල තේරුම</u>

"මම ගරු කරන්න කෙනෙක් හෙව්වට මට වඩා සීලයෙන් උසස් දෙවියෙක් මාරයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මේ සත්ව ප්‍රජාව තුල ඇති බවක් මට බුදු ඇසින් පෙන්නේ නෑ" යනුවෙන් බුදුරජාණන් වහන්සේගේ දේශනා කරනවා.

**"අපරිපූරස්ස ඛො අහං සමාධික්ඛන්ධස්ස පාරිපූරියා අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා සක්කත්වා ගරුං කත්වා උපනිස්සාය විහරෙය්‍යං. න ඛො පනාහං පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා අත්තනා සමාධිසම්පන්නතරං, යමහං සක්කත්වා ගරුං කත්වා උපනිස්සාය විහරෙය්‍යං.**

<u>සිංහල තේරුම</u>

නැවතත් උන්වහන්සේට හිතෙනවා මම ගරු කරන්ට කෙනෙක් හෙව්වට "මට වඩා සමාධියෙන් ඉහළ තැනක ඉන්නාවූ කිසිම බ්‍රාහ්මණයෙක් දෙවියෙක් හෝ මාරයෙක් මේ සත්ව ප්‍රජාව තුල ඉන්නවා කියල මට බුදු ඇසින් පෙන්නේ නෑ" කියලා.

**"අපරිපූරස්ස ඛො අහං පඤ්ඤාක්ඛන්ධස්ස පාරිපූරියා අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා සක්කත්වා ගරුං කත්වා උපනිස්සාය විහරෙය්‍යං. න ඛො පනාහං පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා අත්තනා පඤ්ඤාසම්පන්නතරං, යමහං සක්කත්වා ගරුං කත්වා උපනිස්සාය විහරෙය්‍යං.**

<u>සිංහල තේරුම</u>

ඊළඟට උන්වහන්සේ බලනවා තමන්ට වඩා ප්‍රඥාව දියුණු වෙච්ච කෙනෙක් ඉන්නවද කියලා බලනවා. ඒත් හොයා ගන්න පුළුවන් උනේ නෑ. "මට වඩා ප්‍රඥාවෙන් උසස් කෙනෙක් කිසිම බ්‍රාහ්මණයෙක් දෙවියෙක් හෝ මාරයෙක් මේ සත්ව ප්‍රජාව ඉන්නවා කියල මට බුදු ඇසින් පෙන්නේ නෑ" කියලා උන්වහන්සේ දේශනා කරනවා.

**"අපරිපූරස්ස ඛො අහං විමුත්තික්ඛන්ධස්ස පාරිපූරියා අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා සක්කත්වා ගරුං කත්වා උපනිස්සාය විහරෙය්‍යං. න ඛො පනාහං පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අඤ්ඤං සමණං වා බ්‍රාහ්මණං වා අත්තනා විමුත්තිසම්පන්නතරං, යමහං සක්කත්වා ගරුං කත්වා උපනිස්සාය විහරෙය්‍ය"න්ති.**

<u>සිංහල තේරුම</u>

මීළගට බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා උන්වහන්සේට වඩා වැඩියෙන් විමුක්තිය වඩාපු කෙනෙක් ඉන්නවද කියල බුදු ඇසින් බැලුව නමුත් "මට වඩා විමුක්තියෙන් උසස් කෙනෙක් වත් සමාන කෙනෙක්වත් කිසිම බ්‍රාහ්මණයෙක් දෙවියෙක් හෝ මාරයෙක් මේ සත්ව ප්‍රජාව තුල ඉන්නවා කියල මට බුදු ඇසින් පෙන්නේ නෑ" කියලා උන්වහන්සේ නැවතත් දේශනා කරනවා.

දැන් උන්වහන්සේට ගරු කරන්න හිතෙන කරුණු කාරණා 4 මොනවාද? සීලය, සමාධිය, ප්‍රඥාව. විමුක්තිය. මේ කරුණු හතරෙන් එකකින් හරි උඩින් ඉන්නවනම් පොඩ්ඩක් ගරුකරන්න පුළුවන්. වඳින්න පුළුවන්. ඇප උපස්ථාන කරන්න පුළුවන්නේ. ඇයි එහෙම හොයන්නේ? එහෙම හොයන්නේ ගරු කරන්නේ නැතුව, වැඩිහිටියෙකුට සලකන්නේ නැතුව ඉන්නවා කියන එක දුකක් පීඩාවක්. ඒ මොන ධර්මයේද? ආර්ය ධර්මයේ. ලෝකයේ අනිත් අයට එහෙම ප්‍රශ්නයක් නෑ. මේ තමයි ආර්ය උත්තමයන්වහන්සේ හිතන තාලේ.

ඊට පස්සේ උන්වහන්සේ නැවතත් මෙහෙම දේශනා කරනවා

**“තස්ස මය්හං, භික්ඛවෙ, එතදහොසි – ‘යංනූනාහං ය්වායං ධම්මො මයා අභිසම්බුද්ධො තමෙව ධම්මං සක්කත්වා ගරුං කත්වා උපනිස්සාය විහරෙය්‍ය’’’**

<u>සිංහල තේරුම</u>

“ඊට පස්සේ මට මෙන්න මේ විදියට කල්පනා උනා. මම අවබෝධ කරගත්ත, මාව සම්බෝධියට පත් කරපු, මට සැනසිල්ල ලබාදීපු, මට ප්‍රඥාව ලබා දීපු ඒ ධර්මයටම ගරු කරගෙන, ඒ ධර්මයටම සලකාගෙන හිටියොත් කොච්චර වටිනවද කියලා” යනුවෙන් සිතක් පහළ වූ බව උන්වහන්සේ දේශනා කරනවා.

ඇයි මෙහෙම පස්වෙනි වරට මෙහෙම තීරණයකට ගියේ? සීලයෙන් වැඩි කෙනෙක් හෙව්වා හම්බ උනේ නෑ. සමාධියෙන් වැඩි කෙනෙක් හෙව්වා හම්බ උනේ නෑ. ප්‍රඥාවෙන් වැඩි කෙනෙක් හෙව්වා හම්බ උනේ නෑ. විමුක්තියෙන් වැඩි කෙනෙක් හෙව්වා හම්බ උනේ නෑ. දැන් ස්ථාන 4 කින්ම උන්වහන්සේ බැහැර වෙනවා. පස් වෙනුව කල්පනා කරනවා ‘මම අවබෝධ කරගත්තු ධර්මයටම ගරු කරනවා සත්කාර කරනවා’ කියලා. දැන් මේ විදියට බුදුරජාණන්වහන්සේ හිතන්නේ උරුවෙල අජපාල නම් නුගරුක මුල වැඩ සිටිමින්. දැන් උන්වහන්සේ ගරුකිරීමට ධර්මය තෝරාගත්තා.

**“අථ ඛො, භික්ඛවෙ, බ්‍රහ්මා සහම්පති මම චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය – සෙය්‍යථාපි නාම බලවා පුරිසො සමිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සමිඤ්ජෙය්‍ය, එවමෙවං – බ්‍රහ්මලොකෙ අන්තරහිතො මම පුරතො පාතුරහොසි. අථ ඛො, භික්ඛවෙ, බ්‍රහ්මා සහම්පති එකංසං උත්තරාසඞ්ගං කරිත්වා දක්ඛිණං ජාණුමණ්ඩලං පථවියං නිහන්ත්වා යෙනාහං තෙනඤ්ජලිං පණාමෙත්වා මං එතදවොච – ‘එවමෙතං භගවා, එවමෙතං සුගත! යෙපි තෙ, භන්තෙ, අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා තෙපි භගවන්තො ධම්මංයෙව සක්කත්වා ගරුං කත්වා උපනිස්සාය විහරිංසු; යෙපි තෙ, භන්තෙ, භවිස්සන්ති අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා තෙපි**

**හගවන්තො ධම්මංයෙව සක්කත්වා ගරුං කත්වා උපනිස්සාය විහරිස්සන්ති; හගවාපි, හන්තෙ, එතරහි අරහං සම්මාසම්බුද්ධො ධම්මංයෙව සක්කත්වා ගරුං කත්වා උපනිස්සාය විහරතූ'''ති. ඉදමවොච බ්‍රහ්මා සහම්පති. ඉදං වත්වා අථාපරං එතදවොච –**

<u>සිංහල තේරුම</u>

"ඒ වෙලාවේ මහණෙනි, මම මෙහෙම සිතමින් ඉන්නකොට සහම්පති බ්‍රහ්මරාජයා මම හිතපු දේ සහම්පති බ්‍රහ්මරාජයාගේ හිතින් දැනගෙන = **(මම චෙතසා චෙතොපරිවිතක්කමඤ්ඤාය)** බලවත් පුරුෂයෙක්, හකුලාගෙන සිටිය අතක් දිග හරිනව වගේ දිග හැරපු අතක් හකුලනවා වගේ ඉතාම කෙටි කාලයකින් බ්‍රහ්මලෝකයෙන් අතුරුදහන් වෙලා මගේ ඉස්සරහ පහළ උනා. මා ඉස්සරහ පහළ උනාවූ ඒ සහම්පති බ්‍රහ්මරාජයා උතුරුසලුව ඒකාංශ කොට දකුණු දණහිස පොළොවෙහි තබා මගේ පැත්තට අත් දෙක එකතු කරගෙන මට මෙසේ පැවසුවා, 'එසේමයි භාග්‍යවතුන් වහන්ස, එසේමයි සුගතයන් වහන්ස, ස්වාමීනි බුදුරජාණන්වහන්ස, අතීතයේ පහළ උනාවූ යමකිසි අරහත් සම්මා සම්බුදුරජාණන්වහන්සේ කෙනෙක් වෙත්ද ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුරජාණන්වහන්සේලාත් ධර්මයටම ගරු කරගෙන ධර්මයටම සත්කාර කරගෙන විසුහ. ස්වාමිනී අනාගතයේදී යම් භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුරජාණන්වහන්සේ කෙනෙක් පහළ වෙත් නම් උන්වහන්සේලාත් ධර්මයටම ගරු කරගෙන ධර්මයටම සත්කාර කරගෙන වැඩ ඉන්නා සේක. දැන් වැඩ සිටින අරහත් සමමා සම්බුදුරජාණන්වහ්සේ ඔබ වහන්සේමය. ඔබ වහන්සේත් ධර්මයටම ගරු කරමින් ධර්මයටම සත්කාර කරමින් වැඩ සිටිත්වා' යනුවෙන් ආරාධනාවක් කළා.

(දැන් මෙතනදී පැති දෙකක් කිව්වා. අතීතයේ බුදුරජාණන්වහන්සේලා වැඩ හිටපු විදිය කිව්වා. අනාගතයේදී බුදුරජාණන්වහන්සේලා වැඩ ඉන්න විදිය කිව්වා. සහම්පතී බ්‍රහ්මරජයාට අනාගතය ටිකක් දුර පෙන්වා, නමුත් ධර්ම නියායට අනුව හිතා ගන්නවා).

නැවතත් සහමපතී බ්‍රහ්මරාජයා මෙසේ ගාථා තුනක් තුනක් කියනවා.

| |
|---|
| **‘‘යෙ ච අතීතා සම්බුද්ධා, යෙ ච බුද්ධා අනාගතා;**<br>**යො චෙතරහි සම්බුද්ධො,බහූනං සොකනාසනො** |

<u>සිංහල තේරුම</u>

‘යම්කිසි අතීත සම්බුදුරජාණන්වහන්සේ කෙනෙක් වෙත්ද අනාගතයේ යම්කිසි සම්මා සම්බුදුරජාණන්වහන්සේ කෙනෙක් වෙත්ද වර්තමානයේ යම්කිසි සම්මා සම්බුදුරජාණන්වහන්සේ කෙනෙක් වෙත්ද, සෝකය දැවිල්ල නැති කරගත්තාවූ බුදුරජාණන්වහන්සේලා,

| |
|---|
| **‘‘සබ්බෙ සද්ධම්මගරුනො, විහංසු විහරන්ති ච;**<br>**අථොපි විහරිස්සන්ති, එසා බුද්ධාන ධම්මතා.** |

<u>සිංහල තේරුම</u>

සත්ධර්මයට ගරු කරන අය වනසේක. අතීතයේ වැඩ හිටි සම්බුදුරජාණන්වහන්සේලාත් වර්තමානයේ වැඩ සිටින සම්බුදුරජාණන්වහන්සේත් අනාගතයේ වැඩ සම්බුදුරජාණන්වහන්සේලාත් මෙවැනිම අය වෙන සේක. මෙය බුදුරජාණන්වහන්සේලාගේ ධර්මතාවයකි.

| |
|---|
| **‘‘තස්මා හි අත්තකාමෙන මහත්තමභිකඞ්ඛතා;**<br>**සද්ධම්මො ගරුකාතබ්බො, සරං බුද්ධාන සාසන’’න්ති.** |

<u>සිංහල තේරුම</u>

ඒ නිසා තමන්ට අර්ථය කැමැත්තාවූ අය විසින්, විශේෂත්වයක් මහත් බවක් කැමත්තාවූ අය සත්ධර්මය ගරු තැන්හි තබා ගත යුතුයි, බුදුරජාණන්වහන්සේගේ අනුශාසනය සිහිපත් කරලා’.

මේ කාටද කියන්නේ? අපිටත් එක්කයි.

**තස්මා හි අත්තකාමෙන** = අභිවෘධිය කැමති අය විසින්, සීලයෙන් සමාධියෙන් ප්‍රඥාවෙන් ඉහළට යන්න කැමති අය විසින්, සත්ධර්මයට ගරු කළ යුතුයි, ගුරුතැන්හි තබා ගත යුතුයි. මේ සඳහා බුදුරජාණන්වහන්සේගේ අනුශාසනාව සිහිපත් කළ යුතුයි.

- ඔය කරුණ සිහිගන්වා ගන්න තමයි මම මේ සූත්‍රය ඉදිරිපත් කළේ.

**''ඉදමවොච, භික්ඛවෙ, බ්‍රහ්මා සහම්පති. ඉදං වත්වා මං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා තත්ථෙවන්තරධායි. අථ ඛ්වාහං, භික්ඛවෙ, බ්‍රහ්මුනො ච අජ්ඣෙසනං විදිත්වා අත්තනො ච පතිරූපං ය්වායං ධම්මො මයා අභිසම්බුද්ධො තමෙව ධම්මං සක්කත්වා ගරුං කත්වා උපනිස්සාය විහාසිං. යතො ච ඛො, භික්ඛවෙ, සඞ්ඝොපි මහත්තෙන සමන්නාගතො, අථ මෙ සඞ්ඝෙපි ගාරවො''ති.**

<u>සිංහල තේරුම</u>

'සහම්පති බ්‍රහ්මරාජයා මේ කථාව කිව්වා. මේක කියලා, මටත් වැඳලා ප්‍රදක්ෂිණා කරලා එතනම අතුරුදහන් උනා. ඊට පස්සේ මම මහණෙනි ඒ බ්‍රහ්මයාගේ අදහසත් දැනගෙන, මටත් ගැලපෙන විදියට මම අවබෝධ කරගත්තාවූ සත්ධර්මය ගරු තැන්හි තබාගෙන සත්කාර කරමින් ජීවත්වෙමි. පසු කාලයේදී සංඝ රත්නයත් සීලය වඩාගෙන සමාධිය වඩාගෙන ප්‍රඥාව වඩාගෙන විමුක්තිය වඩාගෙන මහත් තත්වයට පත්වුනා. ගුණයෙන් පිරුණා. එතකොට මට සංඝයාටත් ගරු කිරීමක් ඇති උනා''. යනුවෙන් භාග්‍යවතුන් වහන්සේ දේශනා කළ සේක.

(මෙතැන් තිබෙනවා වචන තුනක්, හොඳට හිතට ගන්න. **ඉදං වත්වා** = මේ කථාව කියලා, **මං අභිවාදෙත්වා** = මටත් වැඳලා, **පදක්ඛිණං කත්වා** = ප්‍රදක්ෂිණා කොට, **තත්ථෙවන්තරධායි** = එතනම අතුරුදහන් උනා) .

දැන් ඉස්සෙල්ලම බුදුරජාණන්වහන්සේ ගරු කරන්නේ ධර්මයට. පස්සේ පස්සේ ඒ ධර්මයෙහිම පිහිටලා සංඝරත්නයත් ගුණයෙන් ඉස්සරහට ආව. එතකොට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා **'අථ මෙ සඞ්ඝෙපි ගාරවො'** = එතකොට බුදුරජාණන් වහන්සේට සංඝයා පිළිබඳවත් ගරු කිරීමක් ඇති උනා කියලා. ඒ කුමක් නිසාද? සීලයෙන් සමාධියෙන්

ප්‍රඥාවෙන් විමුක්තියෙන් යන ගුණවලින් වැඩෙන කොට. බුදුරජාණන්වහන්සේ ධර්මයට වගේම සංඝයාටත් ගරු කළා.

බුදුරජාණන්වහන්සේට එහෙම ධර්ම ගෞරවයක් තිබුණා නම් සංඝ ගෞරවයක් තිබුණා නම් අපි සංඝයාගේ වචන පැත්තකට දාන එක වටිනවද? ගැලපෙනවද? බුදුරජාණන්වහන්සේටත් එහෙම හිතුනා නම් මේ උතුම් ආර්යන් වහන්සේලා රැකලා දීපු ධර්මයට අකටයුත්තක් හැටියට හැසිරෙන්න අගෞරව කරන එක ගැලපෙනවද? උන්වහසේලා බොරු කියලා තියෙනවද? නෑ. උන්වහන්සේලා බොරු කියලා නෑ. පෘතක්ජනයෙකුගේ මුසාවක් මේකට එකතු වෙයි කියන සැකයෙන් තමයි අර පළවෙනි සජ්ඣායනාවේදීත් අනිත් භික්ෂුන්වහන්සේලා ඔක්කොම ටික නගර සීමාවෙන් එළියට දාලා තුන්මාසයක් රැක ගත්තේ. අනාගතේ බලලයි එහෙම කරලා තිබෙන්නේ. යම්කිසි විදියකින්වත් පෘථක්ජන පුළුටක් ඕකේ හිටියා නම් අනිවාර්යයෙන්ම ‘ඔය හිටියේ රහතන්වහන්සේ කෙනෙක් නෙමෙයි. අනිත් අයත් එහෙමයි’ කියලා අද කථා කරනවා. ඒ චෝදනාව නැතිවෙන්න තමයි ඒ ස්වාමීන්වහන්සේලා එදා ඔය වැඩේ කළේ.

මේ සූත්‍රයෙන් අපි දැනගත්තේ බුදුරජාණන්වහන්සේ ගරුකරන්න දෙයක් හොයපු තාලේ. ඒක නිසා බුදුරජාණන්වහන්සේගේ හිතේ පහළ වූ අවබෝධ කරගත්තාවූ දේශනාව රහතන්වහන්සේලා, ශ්‍රාවකයන් වහන්සේලා රැක්කා. ඒක නිසා මම භික්ෂුන්වහන්සේ නමක් හැටියට ගරුකරන්නේ, පිළිගන්නේ, භාරගන්නේ, ඉගෙන ගන්නේ සහ ඉගෙනගෙන කියලා දෙන්නේ ඒ ආර්යන් වහසේලාගේ පෙළින් එන්නාවූ ධර්මය විතරයි, අනිත් ඒවා මම අතගහන්නේ නෑ. ප්‍රශ්නයක් ඇහුවොත් උත්තර දෙන්නේ ඒ ධර්මයට ගැලපෙන ඒවාට විතරයි. ‘අර්ථ’ ‘ධර්ම’ ‘නිරුක්ති’ ‘ප්‍රතිභාන’ යන පටිසම්භිදා ඥාන ගැන සඳහන් වෙන්නෙත් මේ ආර්යන් වහන්සේලාගේ දේශනා වල විතරයි. වෙන කොහේවත් ‘අර්ථ’ ‘ධර්ම’ ‘නිරුක්ති’ ‘ප්‍රතිභාන’ කථාවක් නෑ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස සංගායනාවලදී ත්‍රිපිටකය පාලි භෂාවෙන් ලියපු එක විතරද කළේ අටුවා ලිවීමකුත් කළාද?

<u>පිළිතුර</u> - විශේෂයෙන්ම ත්‍රිපිටකය. පසු කාලීනව තමයි අටුවාවන් පොත්වලට ලියලා තියෙන්නේ.

අපි අහලා තිබෙනවා ස්වාමීන්වහන්ස කලින් සිංහලෙන් අටුවාවක් රහතන්වහන්සේලා ලියලා තිබුණා කියලා. මහවිහාරේ කාලේ ඒවා පුච්චපු කථාවකුත් අහලා තිබෙනවා.

පිළිතුර - එහෙම පුච්චපු කථාවක් නම් නෑ. ඔය පුච්චලා කියලා දැක්ක වගේ කියන්නේ මහා පල් බොරු කාරයෝ. හරියට මේ ළඟ ඉඳගෙන බලාගෙන හිටපු තාලෙට තමයි වාක්‍යය ගත කරන්නේ. ඒ පුච්චපු කථාව සමහරු එහෙම කියනවා. මෙහෙම වෙන්න පුලුවන්. පොත් තිබිච්ච සමහර තැන්වලට විද්ධ වාදීන් ඇවිල්ලා ගිනි තියලා තියෙනවා. විනාස වෙලා තිබෙනවා. ඒකෙදි නැති උනේ අටුවා විතරක් නෙමෙයි, ඔක්කොම ගිනි ගන්නවා. රැකගෙන තිබිච්ච පොත් තමයි ඔය තියෙන්නේ. සමහර වෙලාවට පොඩි පොඩි සූත්‍ර දේශනාවල් තිබිච්ච බවට අටුවාවල් වල සඳහනක් තිබෙනවා නමුත් පෙළේ ඒවා නෑ. ඒවගේ පොඩි පොඩි ඒවා තිබෙනවා. ඒක සමහර විට ගිනිගත්තා වෙන්න පුළුවන්. පොත් ගිනි තිබ්බා කියන එක භික්ෂුන්වහන්සේ නමකගෙන් වෙන්නේ නෑ. හැබැයි වෙන හතුරෙකුගෙන් වෙන්න පුළුවන්. සමහර වෙලාවට ඒවා ආරක්ෂා කරගන්න බැරුව තෙමිලා දිරාපත් වෙලා යන්නත් පුළුවන්.

ප්‍රකාශනයක් - ස්වාමීන්වහන්ස ඔබවහන්සේ කියලා දීපු ධර්මය හරිම වටිනවා. අපි දැනගෙන හිටියෙත් නෑ. අමතක නොවෙන තරම් හොඳට අපි දැනගත්තා. ඔබ වහන්සේට පිං සිද්ද වෙනවා.

ස්වාමීන්වහන්සේ - ඒ ගැන සතුටු වෙනවා. මෙහෙ ඉන්න පිරිස හොඳට ධර්මය ඉගෙන ගන්න ඕනෑ. තවත් තැනකින් මොකක් හරි ඇහෙන කොට ඒක බෙරේ හඬද, සණ්ටාරයේ හඬද, බෙලෙක් හඬද කියලා දැන ගන්න තමන් දැනුවත් වෙලා තියෙන්න ඕනේ. උගත්කම කියලා කියන්නේ අනිත් ඒවා නෙමෙයි. ධර්මය දැනගෙන ඉන්න කෙනා දන්නවා මේක සත්ධර්මයමද නැත්ද කියලා. ධර්මය දැනගෙන ඉන්න එක්කෙනාට වෙන දෙයක් ඇහෙනකොටම දන්නවා මේක නම් ආර්ය ධර්මයක් නෙමෙයි, තථාගත ධර්මයක් නොවෙයි කියලා. ඒ හයිය අපිට තිබෙන්න ඕනෑ.

ස්වාමීන්වහන්ස ඒක තේරුම් ගන්නත් අපි දැනගෙන ධර්මය ඉන්නත් ඕනනේද?

<u>ස්වාමීන්වහන්සේ</u> - අන්න ඒකෙ කැල්ලක් තමයි මේ. ධර්මය දැනගන්න උදව් වෙන එකක් මේ. දැන් බුදුරජාණන්වහන්සේ සංඝයාට ගරුත්වයක් තිබුණද? ඔව් තිබුණා. මේ උරුවෙල සූත්‍රයේ තිබෙනවා ඇයි බුදුරජාණන්වහන්සේ සංඝයාට ගරු කළේ කියලා. බුදුරජාණන්වහන්සේ ධර්මයට ගරුත්වයක් තිබුණද? තිබුණා. ඒ ධර්මයට බුදුරජාණන් වහන්සේ ගරුකරා නම් අපි වැඳ වැඳ පෙරලි පෙරලි ගරු කරන්න එපැය.

<u>ප්‍රශ්නයක්</u> - හරි බුදු දහම කියලා දෙයක් කවුරු හරි පෙන්නනවා නම් අපිට ඒක හරිද කියලා පිළිගන්න මොකක් හරි නිර්ණායකයක්, ක්‍රමවේදයක් තියෙනවද?

<u>පිළිතුර</u> - ඔව් නිර්ණායකයක් තිබෙනවා ක්‍රමවේදයක් තිබෙනවා. ඔන්න එකක්, බුදුරජාණන්වහන්සේ ධර්මයට ගරුකරා අපිත් ඉන්න ඕනේ කොහොමද? අපිත් ධර්මයට ගරුකරන්න ඕනේ.

මේ ගාථාව හොඳට පාඩම් කරගන්න. ඒ සූත්‍ර දේශනාව අවසානයේදී ගාථාවක් තිබෙනවා.

**''තස්මා හි අත්තකාමෙන මහත්තමභිකඞ්ඛතා;**
**සද්ධම්මො ගරුකාතබ්බො, සරං බුද්ධාන සාසන''න්ති**. = අර්ථය කැමත්තාවූ බුද්ධ සාසනයේ මහත් බවට යන්න පැතුමක් තිබෙන්නාවූ අය සත්ධර්මයට ගරු කළ යුතුයි. බුදුරජාණන්වහන්සේත් ධර්මයට ගරුකළා. ඒවගේ අපිත් ධර්මයට ගරු කළ යුතුයි කියලා හිතා ගන්න.

## <u>තථාගතපච්ඡිමවාචා</u>

මේක බුදුරජාණන්වහන්සේ පිරිනිවන් පාන්න කිට්ටුව සිද්ධ වෙන කාරණයක්. මේක හොඳට අහගන්න.

**අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි – ''සියා ඛො පනානන්ද, තුම්හාකං එවමස්ස – 'අතීතසත්ථුකං පාවචනං, නත්ථි නො සත්ථා'ති. න ඛො පනෙතං, ආනන්ද, එවං දට්ඨබ්බං. යො වො, ආනන්ද, මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො, සො වො මමච්චයෙන සත්ථා.**

<u>සිංහල තේරුම</u>

භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්වාමීන්වහන්සේට ආමන්ත්‍රණය කරනවා. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා "ආනන්ද නුඹට මේ වගේ හිතෙන්න පුළුවන්. මේ ධර්මයේ ශාස්තෘන් වහන්සේ සිටියේ අතීතයේ, දැන් අපිට ශාස්තෘවරයෙක් නෑ කියලා. ආනන්ද එහෙම නොසිතිය යුතුයි. ආනන්දය මා විසින් ඔබලාට යම්කිසි ධර්මයක් විනයක් දේශනා කළාද පැනෙව්වද ඒක තමයි මගෙන් පස්සේ ඔබලාට ශාස්තෘන් වහන්සේ".

(බුදුරජාණන්වහන්සේ පිරිනිවන් පෑවාට පස්සේ ආනන්ද හාමුදුරුවන්ට මේ විදියට හිතෙන්න පුළුවන් කියලා උන්වහන්සේ දැක්ක.)

දැන් අපිට ශාස්තෘවරයෙක් ඉන්නවද? ඔව්, අපිට ශාස්තෘවරයෙක් ඉන්නවා. ඒ තමයි ධර්මය. බුදුරජාණන්වහන්සේ වැඩ ඉන්නකොටත් ධර්මයට ගරු කරමින් වැඩ හිටියා, උන්වන්වහන්සේ පිරිනිවන්පාන කොටත් ධර්මය ශාස්තෘ කෘත්‍යය කරනවා කියලා ආනන්ද හාමුදුරුවන්ට ඍජුව ප්‍රකාශ කරලා ශාස්තෘත්වයෙන් පිහිටවෙන ධර්මය අපිට ඉතුරුකරලා උන්වහන්සේ පිරිනිවන් පෑව. ඒක නිසා දැන් අපිට ශාස්තෘවරයෙක් ඉන්නව.

බුදුරජාණන්වහන්සේගේ කාලයේ අපිට ප්‍රශ්නයක් ඇති උනොත් කොහෙටද අපි යන්නේ? අපි බුදුරජාණන්වහන්සේ වැඩ ඉන්න සැවැත්නුවර ජේතවනාරාමයට හරි රජගහ නුවරට හරි විසාලා මහා නුවරට හරි ගිහිල්ලා අහනවා. නැත්නම් බුදුරජාණන්වහන්සේගේ ධර්මය දන්න සැරියුත් හාමුදුරුවෝ හරි මුගලන් හාමුදුරුවෝ හරි ගාවට ගිහිල්ලා අහනවා. නැත්නම් කෙලින්ම යනවා බුදුරජාණන්වහන්සේ ළගට. උන්වහන්සේ ඉතින් අපිට කියලා දෙනවා. දැනුත් බුදුරජාණන්වහන්සේ කටහඬ නැති උනාට උන්වහන්සේ දේශනා කරලා තියෙන ධර්මය අපිට තියෙනවා. දැන් බුදුරජාණන්වහන්සේ වැඩ සිටියා නම් 'අර හාමුදුරුවෝ මෙහෙම කියනවා, රේඩියෝ එකේ මෙහෙම කියනවා' කියල එක එක ස්වාමීන්වහන්සේලාගේ දේශනා ගැන අපිට ඇතිවෙන ප්‍රශ්න අපි උන්වහන්සේ ඇහුවොත් අපිට කියලා දේවි. හැබැයි ඒ උන්වහන්සේ කියලා දෙන ටික මේ ධර්මයේ දේශනා කරලා තියෙනවා. නමුත් අපිට වෙලා තියෙන්නේ, අපි ඒ හරියට යන්නේ නෑ. අපිට ප්‍රශ්නයක් ආවහම අපි දේශනාවක් ගාවට යන්නේ නෑ. තථාගත ශාස්තෘ කෘත්‍ය කරන ධර්මයට යන්නේ නෑ. ඒ ප්‍රශ්නයට උත්තරේ තිබෙන තැන දන්නේ නෑ.

අපිට  රට හොඳට නින්ද යන නිසා කරණීය මෙත්ත සූත්‍රය කියලා නිදා ගන්නවා. යක්කු භූතයෝ එන නිසා රත්න සූත්‍රය පාඩම් කරගෙන කියවා ගන්නවා. හැම සුභ කටයුත්තකදීම මහා  මංගල සූත්‍රය කියා ගන්නවා. ඔය තුනේ ඉඳගෙන දෙවියෝ තරහ වෙයි කියලා ආකාසට්ඨා කියලා පිං දීලා හීනෙන්වත් ඇවිල්ලා අපිව භය කරයි, බෙල්ල මිරිකයි කියලා ඉදංවෝ ඤාතී නං හෝන්තු  කියලා,  නිවන් දකිනතාක් කල්ම අපිට කරදරයක් නොවේවා කියලා ඉමිනා පුඤ්ඤ කම්මේන කියලා,  යම්කිසි වැරැද්දක් උනා නම් කායේන වාචා කියලා සමාවත් අරගෙන ඔය  ටිකේනේ අපි ඉන්නේ.  එහෙම නේද?  ඔතනින් එහාට යන්නේ නෑ.  හැබැයි ඔය ටිකෙන් මේ ධර්මයේ යන්න බෑ.  ඉතිපි සො, ස්වාක්ඛාතො, සුපටිපන්නෝ යන ගාථාවල උනත් හරි තේරුම දන්නේ නෑනේ.

බුදුරජාණන්වහන්සේ අද වැඩ හිටියානම් උන්වහසේගේ බුද්ධත්සවරයෙන් දේශනා කරන්න තියෙන ඔක්කොම ටික මේ දේශනාවේ තියෙනවා. ඒ දේශනාවේ හැංගිච්ච තැනක තිබෙන සූත්‍රයක් තමයි අපි ඔය කිව්වේ. ඒ තමයි බුදුරජාණන්වහන්සේ ධර්මයට ගරු කරපු හැටි. උන්වහන්සේ ධර්මයට ගරු කරන්න තෝරා ගත්තු හැටි. උන්වහන්සේට ධර්මයට ගරු කිරීම පිළිබඳ පහළ වූ සිතුවිල්ලත් සමඟම පහළ වූ සහම්පති මහා බ්‍රහ්මරාජයා ගැනත් ඔක්කොම ඒකේ කියලා දුන්නනේ. අපිත් ධර්මයට ගරු කරන්න ඕනෑ. ධර්මයට මුල් තැන දෙන්න ඕනෑ. ධර්මයට හිත තියන්න ඕනෑ. එතකොට වරදින්නේ නෑ. මොන ප්‍රශ්න පෙරලිලා ආවත් ඒවා ඔක්කොම කැපිලා යනවා.

මේක හොඳට පාඩම් කරගන්න. **'එවං දට්ඨබ්බං. යො වො, ආනන්ද, මයා ධම්මො ච විනයො ච දෙසිතො පඤ්ඤත්තො, සො වො මමච්චයෙන සත්ථා =** මා විසින් දේශනා කරනලද යම්කිසි ධර්මයක් ඇත්ද, විනයක් ඇත්ද ඒක තමයි ඔබලාට මගේ ඇවෑමෙන් ශාස්තෘන්වහන්සේ වන්නේ.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස දැන් ඔබ වහන්සේ  ගොඩක් විස්තර කරලා දුන්නා  අපි කොහොමද ධර්මය පරිහරණය කරන්නේ කියලා. සමහර දේශකයන් කියනවා අපිට මාර්ග ඵල ලැබෙන්නේ නැත්තේ දැනට තිබෙන ධර්මයේ අර්ථ වැරදියි -  දැන් අපි ඉගෙන තියෙන ටික අයින් කරන ක්‍රියා මාර්ගයක් තිබෙනවා කියලා .  ඊට පස්සේ අලුත් අර්ථ දැක්වීම් කියලා

හඳුන්වලා දෙනවා. ඉක්මනට පතිඵල ලැබෙන නිසා සමහර අයගේ කැමැත්තක් තිබෙනවා ඒවගේ මාර්ගයක යන්න.

<u>පිළිතුර</u> - දැන් අපි කිව්වා නේද යම්කිසි ප්‍රශ්නයක් ආවොත් තථාගතයන් වහන්සේ ගාවට යන්න ඕනේ කියලා. අපි දැන් සූත්‍ර දෙකක් කිව්වා. තව එකක් තියෙනවා. මේවා නැතුව එතෙන්ට යන්න බෑ. හැන්ද නැතුව හොද්ද කාල් ගන්න බෑ. ඇඟිල්ලෙන් හොද්ද කාල් ගාන්න ගියොත් මොකද වෙන්නේ? අත පිච්චෙනවා. තව සූත්‍ර දේශනාවක් අපිට තියෙනවා. ඒක නැතුව බෑ. ඇයි මම ධර්මයට ගරු කරන්නේ? රහතන්වහන්සේලාගෙන් පැවැත එන්නා වූ, සංඝයා එකතුවෙලා පරෙස්සම් කරපු ඒ ධර්මය ගැන ගෞරවය තිබෙන නිසා. තැන් තැන්වල කියන අයකෙරෙහි මගේ විශ්වාසයක් නෑ. අපි ධර්මයට අනුව ගලපලා බලන්න ඕනේ. එතකොට තේරෙනවා ගැලපෙන නොගැලපෙන තාලේ.

තව සූත්‍රයක් තිබෙනවා **මහාපදෙස සූත්‍රය** කියලා. බුදුරජාණන් වහන්සේගේ බුදු නුවණින් දැක්ක අනාගතයේදී එක එක්කෙනා එක එක ජාති කියනකොට අපිව අසරණ වෙයි කියලා. ඒ කරුණාවෙන් යුක්තව උන්වහන්සේ අපිට දේශනා කරනවා 'කවුරු හරි ඇවිල්ලා මොනවා හරි කිව්වොත් මෙන්න මේ කරුණුවලට ගලපලා බලන්න' කියලා. **'අපදෙස'** කියලා කියන්නේ කිරා බලන්න, එතනට දාල බලන්න කියන එකයි (criteria)

## <u>මහාපදෙසසුත්තං</u>

**එකං සමයං භගවා භොගනගරෙ විහරති ආනන්දචෙතියෙ තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි – ''භික්ඛවො''ති. ''භදන්තෙ''ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච – ''චත්තාරොමෙ, භික්ඛවෙ, මහාපදෙසෙ දෙසෙස්සාමි, තං සුණාථ, සාධුකං මනසි කරොථ; භාසිස්සාමී''ති. ''එවං, භන්තෙ''ති ඛො තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච –**

<u>සිංහල තේරුම</u>

'භෝග' කියන නගරයේ 'ආනන්ද චේතිය' නම් වූ ප්‍රදේශයේ වැඩ වෙසෙන කාලයෙහි බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට ආමන්ත්‍රණය කරනවා. 'පින්වතුන් වහන්ස', කියලා භික්ෂූන් වහන්සේලා පිළිතුරු දෙනවා. එවිට බුදුරජාණන්වහන්සේ භික්ෂූණී මම නුඹලාට සතර මහා අපදේසයන් දේශනා කරනවා, අහන්න, යහපත්ව මෙනෙහි කරන්න, මම දැන් ඔබලාට

එය දේශනා කරනවා'' යනුවෙන් පවසා බුදුරජාණන් වහන්සේ මෙය වදාළ සේක.

**''ඉධ, භික්ඛවෙ, භික්ඛු එවං වදෙය්‍ය – 'සම්මුඛා මෙතං, ආවුසො, භගවතො සුතං සම්මුඛා පටිග්ගහිතං, අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසන'න්ති. තස්ස, භික්ඛවෙ, භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං නප්පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානි පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔසාරෙතබ්බානි, විනයෙ සන්දස්සෙතබ්බානි. තානි චෙ සුත්තෙ ඔසාරියමානානි විනයෙ සන්දස්සියමානානි න චෙව සුත්තෙ ඔසරන්ති, න ච විනයෙ සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං – 'අද්ධා, ඉදං න චෙව තස්ස භගවතො වචනං; ඉමස්ස ච භික්ඛුනො දුග්ගහිත'න්ති. ඉතිහෙතං, භික්ඛවෙ, ඡඩ්ඩෙය්‍යාථ. තානි චෙ සුත්තෙ ඔසාරියමානානි විනයෙ සන්දස්සියමානානි සුත්තෙ චෙව ඔසරන්ති, විනයෙ ච සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං – 'අද්ධා, ඉදං තස්ස භගවතො වචනං; ඉමස්ස ච භික්ඛුනො සුග්ගහිත'න්ති. ඉදං, භික්ඛවෙ, පඨමං මහාපදෙසං ධාරෙය්‍යාථ.**

<u>සිංහල තේරුම</u>

''මහණෙනි, මේ සතර ආකාරවූ ''මහාපදෙස'' ධර්මයන් කියන්නෙමි. එය හොඳින් අසව්. යහපත්ව මෙනෙහිකරව් කියන්නෙමියි'' වදාළහ. ''එසේය, ස්වාමීනි''යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

''මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම මෙසේ කියන්නේද, 'ඇවැත්නි, මෙය භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරිපිටදීම අසනලදී. මෙය භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරිපිටදීම පිළිගන්නාලදී. මේ ධර්මයයි, මේ විනයයි, මේ ශාස්තෘන් වහන්සේගේ අනුශාසනයයි' කියායි. මහණෙනි, මෙසේ කියනලද ඒ මහණහුගේ වචනයට පළමුවෙන්ම (එක්වරටම) සතුටු නොවිය යුත්තේය. (ආක්‍රොශ වශයෙන්) අහක නොදැමිය යුත්තේය. සතුටුද නොවී, ප්‍රතික්ෂෙපද නොකොට ඒ පද ව්‍යංජනයන් හොඳින් ඉගෙන සූත්‍ර ධර්මයෙහි බහා සසඳා බැලිය යුතුය. විනය ධර්මය හා සංසන්දනයකොට (එක්කර) බැලිය යුතුය. ඉදින් ඒ ධර්මයෝ සූත්‍ර ධර්මය හා සම නොවන්නාහු නම්, විනය ධර්මය හා සංසන්දනය (එක්වීම) නොවන්නාහු නම්, ඒකාන්තයෙන් මේ වචනය ඒ භාග්‍යවතුන් වහන්සේගේ වචනයක් (ධර්මයක්) නොවේ. මේ වචනය මේ

භික්ෂුව විසින්ම වරදවා ගන්නා ලද්දකැයි තීරණයට පැමිණිය යුත්තේය. මෙසේ මේ වචනය දුරුකට යුත්තේය.

“සූත්‍ර ධර්මය හා සමකර බලන්නේ, විනය ධර්මය හා සංසන්දනයකර බලන්නේ, සූත්‍ර ධර්මය හා සම වේද්ද, විනය ධර්ම හා සංසන්දනය වේද්ද, මේ වචනය ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේගේ වචනයක්මයයිද, මේ භික්ෂුව විසින්ද ඒ වචනය මනාකොට ගන්නා ලද්දේයයි තීරණයට පැමිණිය යුත්තේය. මහණෙනි, මේ පළමුවැනි මහාපදෙශ ධර්මයයයි සිත්හි දරා ගනිත්වා.

- මෙය **‘තථාගත මහාපදෙසය’** යනුවෙන් හඳුන්වයි.

> **“ඉධ පන, භික්ඛවෙ, භික්ඛු එවං වදෙය්‍ය – ‘අමුකස්මිං නාම ආවාසෙ සඞ්ඝො විහරති සථෙරො සපාමොක්ඛො. තස්ස මෙ සඞ්ඝස්ස සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං, අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසන’න්ති. තස්ස, භික්ඛවෙ, භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං නප්පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානි පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔසාරෙතබ්බානි, විනයෙ සන්දස්සෙතබ්බානි. තානි චෙ සුත්තෙ ඔසාරියමානානි විනයෙ සන්දස්සියමානානි න චෙව සුත්තෙ ඔසරන්ති, න ච විනයෙ සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං – ‘අද්ධා, ඉදං න චෙව තස්ස භගවතො වචනං; තස්ස ච සඞ්ඝස්ස දුග්ගහිත’න්ති. ඉතිහෙතං, භික්ඛවෙ, ඡඩ්ඩෙය්‍යාථ. තානි චෙ සුත්තෙ ඔසාරියමානානි විනයෙ සන්දස්සියමානානි සුත්තෙ චෙව ඔසරන්ති විනයෙ ච සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං – ‘අද්ධා, ඉදං තස්ස භගවතො වචනං; තස්ස ච සඞ්ඝස්ස සුග්ගහිත’න්ති. ඉදං, භික්ඛවෙ, දුතියං මහාපදෙසං ධාරෙය්‍යාථ.**

<u>සිංහල තේරුම</u>

මහණෙනි, මේ ශාසනයෙහි යම් භික්ෂුවක්, ‘අසවල් ආවාසයෙහි ප්‍රධානවූ ස්ථවිරයන් සහිත භික්ෂු සංඝයා වාසය කරයි. මේ ධර්මයයිද, මේ විනයයයිද, මේ ශාස්තෘන්වහන්සේගේ අනුශාසනාවයයිද, ඒ සංඝයාගේ ඉදිරිපිටදීම අසන ලද්දේය. ඒ සංඝයා ඉදිරියේදීම පිළිගන්නා ලද්දේයයි’ මෙසේ කියන්නේ වේද, මහණෙනි, මෙසේ කියනලද ඒ මහණහුගේ වචනයට එක්වරම

සතුටුනොවිය යුතුයි අත්හැර දැම්මද නොකළ යුතුය. සතුටුත් නොවී, අත්හැර දැම්මත් නොකොට ඒ ව්‍යංජන සහිත පදයන් හොඳින් ඉගෙන සූත්‍ර ධර්මයෙහි බහාලිය යුත්තේය, විනය නීතිය හා සංසන්දනය කළ යුතුය. ඉදින් ඒ වචනය සූත්‍ර ධර්මය හා සම නොවන්නේද, විනය නීතිය හා එක් නොවන්නේද ඒකාන්තයෙන් මේ වචනය භාග්‍යවතුන් වහන්සේගේ වචනයක් නොවන්නේය. ඒ සංඝයාද මේ වචනය වරදවාගන්නා ලද්දකැයි තීරණයට පැමිණිය යුත්තේය. මහණෙනි, මෙසේ මෙය දුරුකට යුත්තේය. ඉදින් ඒ වචනය සූත්‍ර ධර්මය හා සමකරන්නේ, විනය නීතිය හා සංසන්දනය කරන්නේ, සූත්‍ර ධර්මය හා සමවේද විනය නීතිය හා සංසන්දනය වේද ඒකාන්තයෙන් මේ වචනය භාග්‍යවතුන් වහන්සේගේම වචනයක්යයි කියාද, ඒ සංඝයාද මනාකොට ගන්නා ලද්දකැයි කියාද තීරණයටපැමිණිය යුත්තේය. මහණෙනි මේ දෙවැනි මහපදෙශ ධර්මයයි සිත්හි දරාගනිව්.

- මෙය **'සංඝාපදේසය'** නම් වෙයි.

**''ඉධ පන, භික්ඛවෙ, භික්ඛු එවං වදෙය්‍ය – 'අමුකස්මිං නාම ආවාසෙ සම්බහුලා ථෙරා භික්ඛූ විහරන්ති බහුස්සුතා ආගතාගමා ධම්මධරා විනයධරා මාතිකාධරා. තෙසං මෙ ථෙරානං සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං – අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසන'න්ති. තස්ස, භික්ඛවෙ, භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං නප්පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානි පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔසාරෙතබ්බානි, විනයෙ සන්දස්සෙතබ්බානි. තානි චෙ සුත්තෙ ඔසාරියමානානි විනයෙ සන්දස්සියමානානි න චෙව සුත්තෙ ඔසරන්ති, න ච විනයෙ සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං – 'අද්ධා, ඉදං න චෙව තස්ස භගවතො වචනං; තෙසඤ්ච ථෙරානං දුග්ගහිත'න්ති. ඉතිහෙතං, භික්ඛවෙ, ඡඩ්ඩෙය්‍යාථ. තානි චෙ සුත්තෙ ඔසාරියමානානි විනයෙ සන්දස්සියමානානි සුත්තෙ චෙව ඔසරන්ති විනයෙ ච සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං – 'අද්ධා, ඉදං තස්ස භගවතො වචනං; තෙසඤ්ච ථෙරානං සුග්ගහිත'න්ති. ඉදං, භික්ඛවෙ, තතියං මහාපදෙසං ධාරෙය්‍යාථ.**

<u>සිංහල තේරුම</u>

මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම මෙසේ කියන්නේද, අසවල් නම් ආවාසයෙහි බහුශ්‍රැතවූ (බොහෝ උගත්) ආගතාගමවූ, (පැමිණි පිටකත්‍රය ඇති)

ධර්මය දන්නාවූ විනය දන්නාවූ, මාතෘකා පාලිය දන්නාවූ, බොහෝවූ ස්ථවිර භික්ෂුහු වසන්නාහ. මා විසින් මේ ධර්මයයි කියාද මේ විනයයයි කියාද, මේ ශාස්තෘන් වහන්සේගේ අනුශාසනාවයයි කියාද, ඒ තෙරුන්ගේ ඉදිරියේදීම අසනලදී. ඒ තෙරුන්ගේ ඉදිරියේදීම පිළිගන්නා ලදී.' මෙසේ කියනලද ඒ මහණහුගේ වචනයට සතුටු නොවිය යුත්තේය. අහක දැමීමද නොකට යුත්තේය. එසේ සතුටුත් නොවී, ප්‍රතික්ෂෙපද නොකොට පද ව්‍යංජනයන් හොඳින් ඉගෙන සූත්‍ර ධර්මය හා සම කළ යුත්තේය. විනය නීතිය හා සංසන්දනය කළ යුත්තේය සූත්‍ර ධර්මය හා සම කරන කල්හිද, විනය නීතිය හා සංසන්දනය කරන කල්හිද සූත්‍ර ධර්මය හා නොගැළපේද විනය නීතිය හා සංසන්දනය නොවේද, ඒකාන්තයෙන් මේ වචනය භාග්‍යවතුන් වහන්සේගේ වචනයක් නොවන්නේ යයි තීරණයට යා යුත්තේය. ඒ තෙරුන් විසින්ද මේ වචනය වරදවා ගන්නා ලද්දකැයිද කියා, මහණෙනි, ඒ වචනය දුරු කට යුත්තේය.

“ඉදින් ඒ වචන සූත්‍ර ධර්මය හා සම කරන ලද්දේ විනය නීතිය හා සමකරන ලද්දේ, සූත්‍ර ධර්මය හා සමවේද්ද, විනය නීතිය හා සමවේද්ද, ඒකාන්තයෙන් මේ වචනය භාග්‍යවතුන් වහන්සේගේ වචනයෙකැයි තීරණයට පැමිණිය යුත්තේය. ඒ තෙරුන් වහන්සේ විසින්ද මනාකොට ගන්නා ලද්දකැයි තීරණයට පැමිණිය යුත්තේය. මහණෙනි, මේ තුන්වැනිවූ මහාපදෙස ධර්මයයි. හොඳින් සිත්හි දරාගනිව්.

- මෙය **'ථේරාපදේසය'** නම් වෙයි.

**“ඉධ පන, භික්ඛවෙ, භික්ඛු එවං වදෙය්‍ය – 'අමුකස්මිං නාම ආවාසෙ එකො ථෙරො භික්ඛු විහරති බහුස්සුතො ආගතාගමො ධම්මධරො විනයධරො මාතිකාධරො. තස්ස මෙ ථෙරස්ස සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං – අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසන'න්ති. තස්ස, භික්ඛවෙ, භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං නප්පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානි පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔසාරිතබ්බානි, විනයෙ සන්දස්සෙතබ්බානි. තානි චෙ සුත්තෙ ඔසාරියමානානි විනයෙ සන්දස්සියමානානි න චෙව සුත්තෙ ඔසරන්ති, න ච විනයෙ සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං – 'අද්ධා, ඉදං න චෙව තස්ස භගවතො වචනං; තස්ස ච ථෙරස්ස දුග්ගහිත'න්ති. ඉතිහෙතං, භික්ඛවෙ, ඡඩ්ඩෙය්‍යාථ. තානි ච සුත්තෙ ඔසාරියමානානි විනයෙ සන්දස්සියමානානි සුත්තෙ චෙව ඔසරන්ති, විනයෙ ච සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං – 'අද්ධා, ඉදං තස්ස භගවතො වචනං; තස්ස ච**

**ථෙරස්ස සුග්ගහිත'න්ති. ඉදං, භික්ඛවෙ, චතුත්ථං මහාපදෙසං ධාරෙයාථ. ඉමෙ ඛො, භික්ඛවෙ, චත්තාරො මහාපදෙසෙ ධාරෙයාථා''ති.**

<u>සිංහල තේරුම</u>

"මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම මෙසේ කියන්නේද, 'අසවල් ආවාසයෙහි බහුශ්‍රැතවූ (බොහෝ උගත්) ආගතාගමවූ, (පැමිණි පිටකත්‍රය ධර්මය ඇති) ධර්මය දන්නාවූ විනය දන්නාවූ, මාතාකාපාලිය දන්නාවූ එක් ස්ථවිර භික්ෂුවක් වසයි. මා විසින් මේ ධර්මයයි කියාද, මේ විනය නීතිය යයි කියාද, මේ ශාස්තෘන් වහන්සේගේ අනුශාසනාවයයි කියාද, ඒ තෙරුන්ගේ ඉදිරියේදීම අසන ලදී. ඒ තෙරුන්ගේ ඉදිරියේදීම පිළිගන්නාලදී' කියායි. මහණෙනි, ඒ මහණහුගේ වචනයට සතුටු නොවිය යුත්තේය. අහක දැමීමද නොකට යුත්තේය. සතුටුද නොවී අහකද නොදමා පද ව්‍යංජන වශයෙන් හොඳින් ඉගෙන සූත්‍ර ධර්මය හා සමකළ යුත්තේය. විනය නීතිය හා සංසන්දනය කළ යුත්තේය. ඉදින් ඒ වචන සූත්‍ර ධර්මය හා සමකරන කල්හිද, විනය නීතිය හා සංන්දනය කරන කල්හිද, ඉදින් සූත්‍රධර්මය හා නොගැළපේද, විනය නීතිය හා නොසැසඳේද, එකාන්තයෙන් මේ වචනය භාග්‍යවතුන් වහන්සේගේ වචනයක් නොවන්නේයයි තීරණයට පැමිණිය යුත්තේය. ඒ තෙරුන් විසින්ද මේ වචනය වරදවා ගන්නා ලද්දකැයිද තීරණයට පැමිණිය යුත්තේය. මහණෙනි, ඒ නිසා මේ වචනය දුරු කට යුත්තේය.

"ඉදින් ඒ වචනය සූත්‍ර ධර්මය හා සමකරන ලද්දේ, විනය නීතිය හා සංසන්දනය කරනලද්දේ, සූත්‍ර ධර්මය හා ගැළපේද විනය නීතිය හා ගැළපේද, මේ වචනය ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේගේ වචනයකැයි කියාද, ඒ තෙරුන් විසින්ද මනාකොට ගන්නා ලද්දකැයි කියාද තීරණයට පැමිණිය යුත්තේය. මහණෙනි, මේ වනාහි මේ සතර වැනිවූ මහාපදෙශ ධර්මයයි. මහණෙනි, මේ වනාහි ඒ සතර මහාපදෙශ ධර්මයෝයයි හොඳින් දරාගනිව්.

- මෙය **'මහා ථේරාපදේසය'** නම් වෙයි.

දැන් මේ වගේ අපදේස හතරක් තිබෙනවා. ඒක නිසා කවුරු මොනවා කිව්වත් අපි ඉන්න ඕනේ කොහෙද? අපි ඉන්න ඕනේ මේ ධර්මයත් එක්ක. මේ ධර්මය අපිට ශාස්තෘ කෘත්‍ය කරන්නාවූ අපේ ශාස්තෘන් වහන්සේයි. මම භික්ෂුන් වහන්සේ කෙනෙක් හැටියට පිළිගන්නේ මේවාට ගැලපෙනවා නම් විතරයි. අනිත් ඒවා ප්‍රතික්ෂේප කරන්න අමාරුවක් මට කිසිසේත්ම නෑ.

අපිට දැනගත යුතු තවත් කරුණක් තිබෙනවා.

<u>බ්‍රහමජාල සූත්‍රය</u> <u>(කොටසක් පමණයි)</u>

**ඉක්බිති රෑ අලුයම්හි නැගී සිටි, නිෂීදන ශාලායෙහි රැස් වැ හුන් බොහෝ භික්ෂූන් අතර මේ කථාව පහළ විය: "ඇවැත්නි, සත්ත්වයන්ගේ ආශයානුශයයන් දක්නා, අර්හත් වූ සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් සත්වයන්ගේ එකකු අනෙකකුට වෙනස් අදහස් ඇති නියාව කොතරම් මැනවින් සියල්ල දන්නා ලද්දේ ද යන මෙය ආශ්චර්ය ය, අද්භූත ය. මේ සුප්පියපිරිවැජියා වනාහි නොයෙක් කරුණින් බුදු රජාණන් වහන්සේට දොස් කියයි, ධර්මයට දොස් කියයි, සංඝයාට දොස් කියයි. එහෙත් මොහු තරුණ අතැවැසි බ්‍රහ්මදත් තෙමේ නොයෙක් කරුණින් බුදු ගුණ කියයි, දහම් ගුණ කියයි, සඟ ගුණ කියයි. මෙසේ මේ ඇදුරු අතැවැසි දෙදෙන එකෙක් අනෙකාට ඉඳුරා විරුද්ධකථා ඇත්තෝ භාග්‍යවතුන් වහන්සේත් භික්ෂුසංඝයාත් පසුපස්සෙහි ගියෝ වෙති" යනු යි.**

**එ කල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන්ගේ මේ කථාව දැන, නිෂීදනශාලාව කරා එළැඹිසේක. එළැඹ, පණවන ලද අස්නෙහි හිඳගත් සේක. හිඳ ගෙන ම, භික්ෂූන් අමතා "මහණෙනි, තෙපි දැන් කවර කථාවෙකින් හුන්නෝ වහු ද? කවර නම් අතුරු කථාවෙක් තොප විසින් අඩාළ කරන ලද දැ?" යි විචාරා වදාළ සේක.**

**මෙසේ වදාළ කල්හී, ඒ භික්ෂූහු "වහන්ස, මෙහි රෑ අලුයම්හි නැගී සිටි, නිෂීදනශාලායෙහි රැස් ව හුන් අප අතර මේ කථාව පහළ විය: 'ඇවැත්නි, සත්ත්වයන්ගේ ආශයානුශය දන්නා, සියල්ල දක්නා, ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ විසින් සත්ත්වයන් එකකු අනෙකකුට වෙනස් අදහස් ඇති නියා කොතරම් මැනවින් දන්නා ලද ද' යන මෙය ආශ්චර්ය ය, අද්භූත ය. මේ සුප්පිය පිරිවැජියා නොයෙක් කරුණින් බුදු රජාණන් වහන්සේට දොස් කියයි, ධර්මයට දොස් කියයි, සංඝයාට දොස් කියයි. එහෙත් ඔහු තරුණ අතැවැසි බ්‍රහ්මදතා නොයෙක් කරුණින් බුදුගුණ කියයි, දහම්ගුණ කියයි, සඟගුණ කියයි. මෙසේ මේ ඇදුරු අතැවැසි දෙදෙනා එකෙක් අනෙකාට ඉඳුරා විරුද්ධ කථා ඇති වැ භාග්‍යවතුන් වහන්සේත් භික්ෂු සංඝයාත් පසුපස්සෙහි ගියෝ වෙති" යි, වහන්ස, අප අතර මේ කථාව අඩාළ**

**විය. එවිට භාග්‍යවතුන් වහන්සේ මෙහි එළැඹි සේකැ''යි භාග්‍යවතුන් වහන්සේට සැල කළහ.**

**(ඒ භික්ෂූන්ගේ කථාව අසා භාග්‍යවතුන් වහන්සේ වදාරන සේක්) ''මහණෙනි, අනුන් මට දොස් කියතොත්, ධර්මයට හෝ දොස් කියතොත්, සංඝයාට හෝ දොස් කියතොත්, ඒ තන්හි දී තොප විසින් කෝප නො ඉපැදැවියැ යුතු ය. නොසතුට නො ම ඉපැදැවියැ යුතු ය. සිතැ අමනාප බව නොකට යුතු ය. මහණෙනි, අනුන් මට දොස් කියතොත්, ධර්මයට හෝ දොස් කියතොත් සඞ්ඝයාට හෝ දොස් කියතොත් ඒ දොස් කීමෙහි තෙපි කිපෙන්නහු නම්, නොසතුටු හෝ වන්නහු නම්, එයින් තොපට ම (තොපගේ ම ධ්‍යානලාභාදියට) අන්තරාය (බාධා) වන්නේ ය.**

(<u>ස්වාමීන්වහන්සේ</u> - මෙතැනදී අපි ධර්මය වරදවා ගන්න හොඳ නෑ. තරහ ගන්න හොඳ නෑ කියලා මුකුත් නොකර හිටියානම් අද ධර්මයක් නෑ. එහෙම නම් මහා කාශ්‍යප මහා රහතන්වහන්සේ ධර්මය සජ්ඣායනා කරන්න ඉදිරිපත් වෙන්න්නෙත් නෑ, රේවත මහ රහතන්වහන්සේ ධර්මය සජ්ඣායනා කරන්න ඉදිරිපත් වෙන්නෙත් නෑ. මොග්ගලීපුත්ත මහරහතන්වහන්සේ ඉදිරිපත් වෙන්නෙත් නෑ. පොත්වල ලියන්නෙත් නෑ. අද මේ විදියට ලියලවත් තිබෙන්නේ ඒවා රැකපු නිසයි. ධර්මය අධර්මය හොයනවා කියන එකයි තරහා ගන්නවා කියන එකයි වැඩ දෙකක්. ඕක පටලවා ගන්න හොඳ නෑ. තරහ ගියොත් ඇත්තද නැත්තද කියලා දැන ගන්න බෑ. ඒක නිසා කරන්න තිබෙන්නේ මොකක්ද? ඒ කියන වාක්‍යය හොඳට අහගන්න එක).

<u>නැවතත් සූත්‍රය</u>

**''මහණෙනි, අනුන් මට හෝ ධර්මයට හෝ සංඝයාට හෝ දොස් නගතොත්, එහි තෙපි කුපිත වන්නහු නම්, එසේ කල්හී තෙපි ඒ අනුන් කී දෑ සුභාෂිත ද (සත්‍ය කථාවෙක් ද) නැතහොත් දුර්භාෂිත ද (අසත්‍ය කථාවෙක් දැ) යි දැනැ ගත හැකි වන්නහු දැ?" යි ප්‍රශ්න කළ සේක.**

**''වහන්ස, මෙය නොවන්නේ ම යැ (කිපුණොත් කියන කථාවේ ඇත්ත නැත්ත දැන ගත හැකි නො වන්නමෝ මැ යැ)'' යි ඒ භික්ෂූහු උත්තර දුන්හ.**

**(එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළසේක.) ''මහණෙනි, අනුන් මට හෝ ධර්මයට හෝ සංඝයාට හෝ දොස් කියතොත්, එහි තොප විසින් 'මේ**

**කාරණයෙනුත් මෙය අභූතයෙකි. මේ කාරණයෙනුත් මෙය අසත්‍යයෙකි. මේ කියන දෝෂය අප කෙරෙහි නැත, මෙය අප කෙරෙහි අවිද්‍යාමාන යැ' යි නැති දොස් නැති සැටියට ම ලිහා ඉවත් කළ යුතු ය''.**

**''මහණෙනි, අනුන් මාගේ හෝ ධර්මයේ හෝ සංඝයාගේ හෝ ගුණ කියතොත්, එහි තොප විසින් ප්‍රීතිය නො ඉපදැවිය යුතු ය. සොම්නස නො කළ යුතු ය. සිතෙහි ප්‍රීතියෙන් ඉල්පුණුබව නො කළ යුතු ය. මහණෙනි, අනුන් මාගේ හෝ ගුණ කියතොත්, ධර්මයේ හෝ ගුණ කියතොත්, සංඝයාගේ හෝ ගුණ කියතොත්, එහි තෙපි ප්‍රීති වන්නහු නම්, සතුටු වන්නහු නම්, තොපට ම එයින් අන්තරාය වේ. (=තොපගේ ම ධ්‍යානාදීගුණලාභයට එය බාධක වේ.) මහණෙනි, අනුන් මාගේ හෝ ධර්මයේ හෝ සඞ්ඝයාගේ හෝ ගුණ කියතොත්, එහි තොප විසින් 'මේ කරුණිනුත් මෙය ඇත්ත ය. මේ කරුණිනුත් මෙය එසේ ම ඇති එකෙක. මෙය අප කෙරෙහි ඇත්තේ වේ. මෙය අප තුළ විද්‍යාමාන ම යැ' යි ඇතිගුණ ඇතිගුණ වශයෙන් පිළින කට යුතු යි.**

<u>ස්වාමීන්වහන්සේ</u> - දැන් මම කරුණු 4 ක් කිව්වා. **'ප්‍රථම උරුවෙල සූත්‍රය'** කිව්වා. තථාගතයන් වහන්සේගේ **'පච්ඡිමවාචාව'** කිව්වා. **'මහාපදේස හතර'** කිව්වා. **'බ්‍රහ්මජාලසූත්‍රයෙන් අපිට තරහ ගන්න එපා වශයෙන් දීපු අවවාද'** කිව්වා. සමහර වෙලාවට මොකක් හරි ඇහුවට පස්සේ අපි සන්තෝසයෙන් ඉලිප්පිලා යනවා. ගොඩ පිටින්ම බාර ගන්නවා. ඇත්ත නැත්ත හිතන්න අපිට බැරි වෙනවා. අන්න ඒක නිසා තමයි තරහා ගන්නත් එපා, සතුටු වෙන්නත් එපා කියලා කිව්වේ. එතනදී උපේක්ෂා ගුණය තියා ගන්න ඕනේ.

ඒකනිසා ඔය මහත්තයා ඇහුව ප්‍රශ්නෙට පදනම් ටිකක් තිබෙනවා. ඒක නැතුව, මේ කරුණු ටික තියාගෙන, මේ කියපු ධර්ම කරුණු වලට අනුවයි බලන්නේ. එහෙම බලල ගැලපෙන්නේ නැත්නම් කිසිම පැකිලීමක් වෙන්න හොඳ නෑ ඒක ප්‍රතික්ෂේප කරන්න. ඇයි ඒ? අපි ගරුකරන්නේ තථාගතයන් වහන්සේගේ ධර්මය රැකපු මහා සංඝරත්නයට. පුද්ගලිකව මට ඒ මහා සංඝරත්නය පිළිබඳව කිසිම සැකයක් නෑ. වෙන අයට තියෙන්න පුළුවන්. ඒක මගේ ප්‍රශ්නයක් නෙමෙයි. අපේ ගුරුවරුන්ගේ ප්‍රශ්නෙකුත් නෙමෙයි.

ඊළඟට මේ ධර්මය ලියපු විදියක් තිබෙනවා. රැකපු විදියක් තිබෙනවා. ඒක පරෙස්සම් කරපු විදියක් තියෙනවා. එක එක්කෙනාගේ දෘෂ්ඨීන් වෙනස්. අපි බලන්න ඕන ඒ කියන කරුණු මේවට ගැලපෙනවද කියලා. නැත්නම් අයින් කරනවා. මහත්තය ආයිමත් ඒ ප්‍රශ්නය කියන්න පුලුවන්ද?

<u>ප්‍රශ්නය</u> - යම්කිසි ප්‍රසිද්ධිය දරන කෙනෙක් යම්කිසි ධර්මයක් ඉදිරිපත් කළහම ඒක නියම බුදුදහම කියලා තෝරා ගන්න නිර්ණායකයක් තියෙනවාද කියලා.

<u>ස්වාමීන්වහන්සේ</u> - අන්න හරි, ඒ නිර්ණායකයේ කොටස් තමයි මේ කිව්වේ. අපි ඕකට අනුව තමයි බලන්න ඕනේ. මේ විදියට බලන එක වැරදිද? බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තිබෙන විදියට අපි බලනවා. දිග පළල බලලා මැනලා, ගන්න ඕන එකක් තියෙනවා නම් ගන්නවා නැත්නම් අයින් කරලා දානවා. කාටද කියන්න පුළුවන් ඒ ක්‍රමය වැරදියි කියලා. මේක තමයි අපිට උගන්නලා තිබෙන විදිය. මේ ක්‍රමයට තමයි අපි යන්නේ.

<u>ප්‍රශ්නයක්</u> - එතකොට ස්වාමීන්වහන්ස අපි ගොඩක් දේවල් දැනගන්න ඕනේ නේද? පටිච්චසමුප්පාදයට ගලපන විදිය ...

<u>ස්වාමීන්වහන්සේ</u> - දැන් තේරෙනව නේද බරපතල කම. පටිච්චසමුප්පාදයට ගලපන විදි තියෙනවා. වචනම නෙමෙයි, වචන තිබෙනවා නමුත් ඒවා එක එක විදියට යොදන්න පුළුවන්, හරවන්න පුළුවන්, ගලපන්න පුළුවන් හැබැයි ඒ ධර්මය ඒකට ගැලපෙනවද කියලා හොඳට බලන්න ඕනේ.

අපි දෙකක් තුනක් ගලපලා බලමු. මට පුළුවන් කම තිබුණා මේ පින්වතුන්ට කියන්න බ්‍රහමජාලය බලන්න කියලා, මට තිබුණා කියන්න මේ පින්වතුන්ට උරුවෙල සූත්‍රය බලන්න කියලා. නමුත් මම එහෙම කිව්වේ නැත්තේ මම දන්නවා මේ පින්වතුන්ට එහෙම තේරුම් ගන්න ටිකක් අමාරුයි කියලා. මේක සිංහලෙනුත් තිබෙනවා පාලියෙනුත් තිබෙනවා. අපි කෙනෙකුට එහෙම පවරන්න හොඳ නෑ. සූත්‍රයක් කියලා කියන්නේ වාක්‍යයක් විතරක් නෙමෙයි. ඒකෙ මුලක් තිබෙනවා මැදක් තිබෙනවා අගක් තිබෙනවා. එතකොට තමයි හොඳට තේරෙන්නේ.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස ආනාපාන සති භාවනාවේ අස්සාස කියන්නේ ආශ්වාසය නෙමෙයි, ආස්වාදය කියලා කියන එක උදාහරණයක් වශයෙන් අපිට ගලපන්න පුලුවන්ද ධර්මයට?

<u>ස්වාමීන්වහන්සේ</u> - පුළුවන්. ඉස්සෙල්ලා බලන්න ඕනෙ 'අස්සාස' කියන වචනය තියෙන්නේ කොතනද, මොකක්ද ඒකෙ අර්ථය කියලා. මේ වචනය මට මතක හැටියට කාලාම සූත්‍රයෙහි තිබෙනවා. ඒකෙන් කියන්නේ යම්කිසි සැනසිල්ලක් කියන එක. අස්සාස කියන වචනයේ අර්ථ කීපයක් තිබෙනවා. යම් අර්ථයක් ඒ සිද්ධියේ හැටියට ගන්නවා ඇරෙන්න එක තැනක තිබෙන

අර්ථය  තව තැනකට ගලපලා ගන්න බෑ. ඒක හැටියක්. 'කලාව' කියන වචනය  හැම තැනටම ගලපන්න බෑ. මොකක්ද 'කලාව' කියන්නේ? Art වලටත් කියනවා 'කලාව' කියලා. වේලාව බලන කොටත් කියනවා 'කලාව' කියලා ( විස බහින කලාව, නගින කලාව වශයෙන්). අනිත් එක තමයි යම්කිසි වැඩක් කරනකොට ඒකෙ තියෙනවා යම්කිසි ක්‍රමයක්, හැඩයක්  'කලාවක්'. දැන් බලන්න 'කලාව' කියන වචනය ස්ථාන තුනකම අර්ථ තුනකින් පාවිච්චි වෙනවා. 'අස්සාස' කියන වචනයත්  යම්කිසි 'සැහැල්ලුවක්' 'සැනසීමක්' කියන එකටත් යෙදෙනවා. 'ප්‍රාර්ථනාවටත්' යෙදෙනවා. 'ආශ්වාස' වලටත් යෙදෙනවා.  'අස්සාස' කියන එකෙන් ආශ්වාස විතරයි කියවෙන්නේ. 'පස්සාස' කියන එකෙන් ප්‍රාශ්වාස විතරයි කියවෙන්නේ.

ඇත්තටම ආශ්වාස ප්‍රාශ්වාස කියන එකට ඕක අහන්න දෙයකුත් නෙමෙයි. පටිසම්භිදාමග්ගයෙත් ආනාපාන සති සූත්‍රයෙත් ඒවාගේම සති පට්ඨාන සූත්‍රයෙත් හොඳට පැහැදිලිව පිරිසිඳුව දේශනා කරලා තිබෙනවා.  ඒක එහෙම නොවෙයි කියලා කියන්න භික්ෂුන්වහන්සේ කෙනෙකුට නම් අමාරුයි.  ආර්ය ධර්මයෙහි පිහිටියාවූ,  ආර්ය ධර්මයට ගරු කරන,  ආර්ය ධර්මයට අනුයාත වූ, සත්පුරුෂ අදහස් තිබෙන කෙනෙක් නම් ඒවා වෙනස් කරන්නෙම නෑ.  ඒකට මට සූත්‍රයක් පෙන්නන්න පුළුවන්. දීඝ නිකායේ තිබෙන 'මහා සතිපට්ඨාන සූත්‍රය' හිතලා හදාගත්ත එකක් නෙමෙයි. ඒක  රහතන්වහන්සේලා සජ්ඣායනා කරපු ආනන්ද ස්වාමීන්වහන්සේගෙන් ආරම්භ වෙච්ච සස පරපුර රැකපු සූත්‍රයක්.  මේ මහා සතිපට්ඨාන සූත්‍රයට අනුයතාව හිත යොදලා,  ඒ වාගේම ආශ්වාස ප්‍රාශ්වාසයට හිත යොදලා ඒකෙන් ප්‍රථම ධ්‍යානය ලබාගෙන, ද්විතීය ධ්‍යානය ලබාගෙන,  තෘතීය ධ්‍යානය ලබාගෙන,  හුස්ම පිහිටන්නේ නැති  චතුර් ධ්‍යානය පිහිටුවාගෙන,  අභිඤ්ඤා ලබාගෙන ඒ තුලින් හේතු ඵල ධර්මයන් හොඳින් බලාගෙන පටිච්චසමුප්පාදය අවබෝධ කරගෙන නිවනින් සැනසිච්ච විශාල රහතන්වහන්සේලා පිරිසක් ඉන්නවා, ලොව්තුරා බුදුරජාණන්වහසේත් ඇතුළුව. ඒවගේ විශාල පිරිසක් නිවනින් සැනසී ගියාවූ, ඒ නිවනට පත් කලාවූ ආර්ය අශ්ඨාංගික මාර්ගය හොඳට කියලා දෙන්නාවූ, බොජ්ඣංග ධර්ම හොඳින් වැඩෙන්නාවූ,  ඉන්ද්‍රිය ධර්මයන් හොඳින් වැඩී යන භවනා ක්‍රමයක්,  ඒ වගේ ආර්ය මාර්ගයක්,  නිවන් මාර්ගයක් හැල්ලුවට ලක් කිරීම මහා පාප කර්මයක්. ගරහන්න හොඳ නෑ. කිසිම කාලයක හිතක් නිකලෙස් කරාවූ,  සසර දුකින් හේතුඵල ධර්මයන්ගෙන් මුදවා නිවනට පත් කලාවූ ඒ භාවනා පිළිවෙතට,  ඒ භාවනා ක්‍රමයට, ඒ  මහා පුරුෂ භාවනාවට, ඒ  අනාපාන සති භාවනාවට නිගරු නොකළ යුතුයි.   අවතක්සේරු  නොකළ යුතුයි.  කරන්න බැරිනම් නිකන් කට පියාගෙන ඉන්න එක වෙන කාරණයක්. ක්‍රිස්තියානි කාරයන්ට ඕක සිද්ධ වෙන්නේ නෑ, මුස්ලිම් කාරයන්ට ඕක සිද්ධ වෙන්නේ නෑ. ඇයි? ඒ ගොල්ලෝ දන්නෙත් නෑ, බනින්නෙත් නෑ. හැබැයි

ඒක ඉස්මතු කරලා ඒකට දොස් කීම, අවතක්සේරු කිරීම, බැණ වැදීම, නිගරු කිරීම, ඒවාගේම ඒවා මිනිස්සුන්ගේ හිත්වලින් ඈත් කිරීම තමන්ගේ නිවන් මග අහුරවා ගැනීමක්, වලකා ගැනීමක්. ඒක තමයි තථාගත ධර්මයේ හැටියට මට සෘජුව කියන්න පුළුවන් කම තියෙන්නේ.

<u>මහත්මයෙක්</u> - ස්වාමීන්වහන්ස ඒ කියන පුද්ගලයා තමන් ආර්යන් වහන්සේ කෙනෙක් හැටියට පෙනී හිටිමින් කියන්නේ. ඒක ලෞකික භවනාවක් වශයෙන් කරාට කමක් නෑ හැබැයි ලෝකෝත්තර භාවනාවක් වශයෙන් කරන කොට ආදීනව නිස්සරණය ඔස්සේ යන විදියට කෙරෙන්න ඕනේ කියලා තමයි කියන්නේ.

<u>ස්වාමීන්වහන්සේ</u> - දැන් බලන්න එහෙම කියනකොට මහත්තයා සාරිපුත්ත මහා රහතන්වහන්සේගේ ඉඳලා පළවෙනි ධර්ම සංගායනාවේ හිටපු ස්වාමීන්වහන්සේලාටත් දෙවෙනි ධර්ම සංගායනාවේ හිටපු ස්වාමීන්වහන්සේලාටත් තුන්වෙනි ධර්ම සංගායනාවේ හිටපු ස්වාමීන්වහන්සේලාටත් මේවා ලියපු ස්වාමීන්වහන්සේලාටත් දේශනා කරපු බුදුරජාණන්වහන්සේලාටත් ගෞරවයක් තිබෙනවද? මේ ස්වාමීන්වහන්සේලා දේශනා කරපු නිසා තමයි අද අපිට කියන්න පුළුවන්, ඒක නිසා තමයි මිනුස්සු මේ තැන් තැන් වල භාවනා කරන්නේ කියලා හැඟීමක් තියෙනවද? නැනේ. ආර්ය කෙනෙක් එහෙම කියයිද? ආර්යන් වහන්සේ කෙනෙකුගේ විශේෂ ගුණ තිබෙනවා. ආර්ය තත්වයට පත්වෙන්නේ කල්‍යාණ පෘතක්ජනයෙක්නේ. පෘතක්ජන වර්ග කීයක් ඉන්නවද? දෙන්නයි, එක්කෙනක් අන්ධ පෘතක්ජනයි. අනිත් එක්කෙනා කල්‍යාණ පෘතක්ජනයි. කල්‍යාණ පෘතක්ජන භාවයේ ඉඳගෙන තමයි දාන සීල භාවනා ආදී පිංකම් සිද්ධ කරන්නේ. එයාට කර්මය කර්මඵලය වැටහෙනවා. එතකොට එයානේ බුදු පසේ බුදු මහරහත් භාවයට පත්වෙන්න සමථ විපස්සනා ඥාන දියුණු කරන්නේ, වඩන්නේ. එතකොට ඒ කල්‍යාණ පෘතක්ජන භාවයේ ඉන්නා කෙනා කවදාකවත්ම ධර්මයට අගෞරව කරන්නේ නෑ. තුනුරුවන් කෙරෙයි හොඳ ගෞරවයකින් භක්තියකින් ඉන්නේ. එයාගේ සීලය හරි පිරිසිදුයි. ඊළඟට අපි හිතමු ආර්ය භාවයට පත්වෙනවා කියලා. ආර්ය භාවයට පත්වෙනවා කියලා කියන්නේ ඊටත් වඩා සුපිරියි, ශ්‍රේෂ්ඨයි. ආර්ය භාවයට පත්වෙනවා කියලා කියනකොට මාර්ග ඵල අවබෝධ කරගෙන අවම වශයෙන් සෝවාන් මාර්ග ඵලයෙන් ඉහළට යන්න ඕනෑ. එහෙම ආර්ය තත්වයට පත් වූ කෙනෙක් කිසිම දවසක තථාගතයන් වහන්සේට අගෞරව කරන්නේ නෑ. ධර්මයට අගෞරව කරන්නේ නෑ. සංඝයාට අගෞරව කරන්නේ නෑ. ශික්ෂාවන්ට අගෞරව කරන්නේ නෑ. කවදාකවත්ම කෝතුහල මංගල කියන ඒවා සලකන්නේ නෑ.

මේ කරුණු ගැන සැලකීමක් නැත්නම් ධර්මයට අනුකූලව අපිට තේරුම් ගන්න තියෙන්නේ ඒ වචන  ආර්යන් කෙනෙකුගෙන් පිටවෙන වචන නෙමෙයි කියලා.

මේ විදියට හිතන්න බලන්න. සම්මා සමාධිය කියන්නේ මොකක්ද? සම්මා සමාධිය තියෙන්නේ ආර්ය අශ්ඨාංගික මාර්ගයේ. සම්මා සමාධිය නිවන් පිළිවෙතේ එක් අංගයක්.  සති පට්ඨාන සූත්‍රයේ තිබෙනවා සම්මා සමාධියට යන තැනක්. ධම්මානුපස්සනාවේ   මාර්ග සච්ච කියන තැන තියෙන්නේ. සම්මා සමාධිය කියන තැන අදියර  4 ක් තිබෙනවා.   ප්‍රථම ධ්‍යානය, ද්විතීය ධ්‍යානය,  තෘතීය ධ්‍යානය සහ  චතුත්ථ ධ්‍යානය.   ඒ සමාධිය තමයි සම්මා සමාධි. අනාපාන සති භාවනාවෙන් සම්මා  සමාධිය පිහිටුවාගෙන  චතුත්ථ ධ්‍යානයට යන්න බැරිද?  පුළුවන්ද?  පුළුවන්.  එහෙම ගියපු අය ඉන්නවද නැත්ද?  ගිහිපු අය ඉන්නවා,  අපිත් දන්නවා.  හොඳට  පැහැදිලිව පිරිසිඳුව ඒ සම්මා සමාධි භාවනාවේ ගමන් කරලා ප්‍රථම, දෙවෙනි, තුන්වෙනි, හතරවෙනි ධ්‍යාන ලබාගෙන ඒක පාදක කරගෙන නිවන් අවබෝධ කරගත්ත අය වර්තමානයේත් ඉන්දෙද්දී,  බුදුරජාණන්වහන්සේත් ඉන්දෙද්දී, ඒ නිවන් රස විඳපු, ‘ඒකායනෝ අයං භික්ඛවේ මග්ගෝ’  කියන එකට අනුයාත කරලා බුදුරජාණන්වහන්සේ දෙසූ ධර්මයක් ඒවගේ අවතක්සේරු කරන්න පුලුවන්වෙයිද  ආර්ය කෙනෙකුට?  එහෙම කරයිද? යහපත් කල්‍යාණ අදහස් තිබෙන්නාවූ කෙනෙක්වත් කරන්නේ නැති එකක්නේ ඒක.  අපිට තථාගතයන් වහන්සේ කියලා තිබෙනවානේද  ‘මහණෙනි මේ විදියට හිතන්න’ කියලා. අංගුත්තර නිකායේ චක්ක නිපාතයේ තිබෙනවා ආර්යන් වහන්සේ කෙනෙක් තුල  තිබෙන්නාවූ අභව්‍ය කරුණු පෙන්වාදෙන සූත්‍ර පෙළක්.

අනිත් එක තමයි ශික්ෂා ගරුත්වය. කවදාකවත්ම ආර්ය තත්වයට පත්වූ කෙනා ශික්ෂාවන් නොසලකා හරින්නේ නෑ. හරියට ශික්ෂා ගරුත්වය තිබෙනවා. අපි හිතමු අටසිල් සමාදන් වෙලා ඉන්න ගිහි ආර්යයා කවදාකවත් මත්පැන් බොන්නේ නෑ. හොරකම් කරන්නේ නෑ.  විකාලයේ කන්නේ නෑ. කවදාකවත්ම නූඩ්ල්ස් පැකට් එකක්වත් කන්නේ නෑ.  ඇයි ඒ?  සීලයෙහි පිහිටනවා.   භික්ෂූන්වහන්සේ  නමක් නම් විකාලභෝජනයවත් වෙනත් ශික්ෂා විරුද්ධකම් කිසිම දෙයක් කරන්නේ නෑ. ආර්ය තත්වයට පත්වෙලා කියන අය ඒවා කරනවා කියලා කියන්නේ ආර්ය නෑ කියන එකයි.

<u>මහත්මයෙක්</u> - ඒගොල්ලො කියන්නේ සීලය උසස් ලෙස සැලකීම සීලබ්බත පරාමාසයක් කියලා .

<u>ස්වාමීන්වහන්සේ</u> - ඒක වැරදි කථාවක්. ඒක සම්පූර්ණ වැරදියි. ඉස්සෙල්ලා දැනගන්න ඕනේ සීලය කියන්නේ මොකක්ද? වත කියන්නේ මොකක්ද? කියලා. සීලබ්බත කියන්නේ සීල වත කියන එකයි. සීල වත කියල කියන එක පටිසම්භිදාවේ හොඳට තෝරලා තිබෙනවා. ධූතාංග කියන්නේ 'වත්'. ඒකට හරි ගැම්මක් අවශ්‍ය යයි. සීලය කියලා කිව්වහම සතර සීලයක් තිබෙනවා. එකක් **ප්‍රාතිමෝක්ෂ සංවර සීලය**. එනම් බුදුරජාණන්වහන්සේ පනවපු විනය. බුදුරජාණන්වහන්සේ ගිහියන්ට ශික්ෂාපද පනවලා නෑ. ඒක භාර ගන්න තියෙන්නේ. බුදුරජාණන්වහන්සේ අපිට කිව්වේ නැනේ 'මහණෙනි ඇවිල්ලා මහණවෙන්න මේකේ හොඳ ක්‍රමයක් තිබෙනවා' කියලා, අපිනේ ආවේ. එතකොට බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා ' ඔබලා මේකට ඇවිල්ලා ඉන්නවා නම් මෙන්න මේ විදියට පරෙස්සමෙන් ඉන්න' කියලා. ඒක අපි භාර ගන්න ඕනේ. Company එකක වැඩට ගියාට පස්සේ අපිට ඕනේ ඕනේ ඒවා නෙමෙයිනේ කරන්නේ. ඒකෙ තිබෙන නීති වලට අපි එකඟ වෙනවනේ. එහෙම නැත්නම් ඒකෙන් පිට වෙන්න ඕනේ. එතකොට අපි ඒකට ගිහිල්ලා අපිට ඕනේ විදියට කරන්න ගියොත් ගැලපෙනවද? බුදුරජාණන්වහන්සේ අපිට කිව්වේ නෑ එන්න කියලා. අපි තමයි ආවේ. බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා උපසම්පදා භික්ෂූන්වහන්සේ නමකට 227 ශික්ෂාවන්. භික්ෂුණීන් වහන්සේලාට තිබෙනවා තුන්සියයට වැඩි ශික්ෂාපද ප්‍රමාණයක්. භික්ෂූන්වහන්සේ නමකට ප්‍රාතිමෝක්ෂ වශයෙන් තිබෙන ඒ ශික්ෂාපද 227 පණ වගේ රකින්න ඕනේ. ඒකට කියනවා **අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු'** = 'මහණෙනි අල්පමාත්‍ර වූ වරදෙත් භය දැකලා හොඳින් ශික්ෂාපදය සමාදන්වෙලා රැකෙන්න හික්මෙන්න' කියලා. මේක බුදුරජාණන්වහන්සේගේ දේශනාව. ඒවාගේම 'මාගේ ශ්‍රාවකයන් වහන්සේලා අනුමාත්‍ර වූ වරෙදෙත් භය දකිනවා' කියලා බුදුරජාණන්වහන්සේත් දේශනා කරනවා. මේක ආර්ය ශ්‍රාවකයන්ගේ හැටි. ප්‍රාතිමෝක්ෂ සංවර සීලය කියන එක සීලබ්බත පරාමාස වෙන්නේ නැහැ. එතකොට ධර්මය කැඩුවා වෙනවා. සීලබ්බත පරාමාස වෙන්නේ මිත්‍යා අදහසක්. ඒකට ගන්නේ ගෝවෘත, අජවෘත, බල්ලෝ වගේ කැරකිලා බිමට දාපු බත් කන ඒවා. තථාගතයන් වහන්සේගේ තිබෙන්නේ ආර්ය සීල. ආර්ය සීලය කොහොමද සීලබ්බත පරාමාස වෙන්නේ?

අනිත් එක තමයි **ඉන්ද්‍රිය සංවර සීලය**. තුන්වෙනි එක තමයි **ආජීව පාරිසුද්ධ සීලය**. හතරවෙනි එක **ප්‍රත්‍ය සන්නිශ්‍රිත සීලය**. ආජීව පරිසුද්ධි සීලය කියලා කියන්නේ යහපත්ව ලැබෙන්නාවූ දෙයක්, ධර්මානුකූලව ලැබෙන්නාවූ දෙයක් පමණක් වැළඳිය යුතුයි. පරිභෝග කල යුතුයි. කිසිම දවසක සිවුරක්වත් කට වචනයෙන් ඉල්ලා පරිභෝග කරන්න හොඳ නෑ. කඨින සිවුරු එහෙම මහණ කොට මෙහෙම කරන්න කියලා පාට කියන්න හොඳ නෑ. නූල් වර්ග කියන්න හොඳ නෑ, රෙදි වර්ග කියන්න හොඳ නෑ. හම්බ වෙන එකක් ගන්න ඕනේ. ඒවා බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තිබෙන ආර්ය ධර්ම. ආර්ය ධර්මයක් නොවෙන එකක් නම් ඒ විදියට වෙන්න පුළුවන්. කවදාවත් භික්ෂුන් වහන්සේ නමක් නම් ආශ්වාසයට ප්‍රාශ්වාසයට ඔය විදියට කියන්නෙත් නෑ. අවතක්සේරු කරන්නේ නෑ. නිගරු කරන්නේ නෑ. ආර්යන් වහන්සේ නමක් නම් එහෙම කියන්නේ නෑ. මට හොඳටම විශ්වාසයි.

අනිත් එක තමයි ආර්ය භාවයට පත් වෙච්ච කෙනෙක් විකාල භෝජනය වගේ දේවල් වලට යන්නේ නෑ. මුදල් පරිහරණය කරන්නේ නෑ. ශික්ෂාපද ගෞරවය හරියට තියෙනවා. ඉස්සර කාලේ රහතන්වහන්සේලා කියපු අය ළඟට රජවරු ගිහිල්ලා දෙහි කපලා කාල තිබෙනවා. රහතන්වහන්සේලාට තිබෙනවා ෂළඩග උපේක්ඛාව කියලා ගුණයක්. ෂළඩග උපේක්ඛාව කියලා කියන්නේ ඇහෙන්, කනෙන්, නැහැයෙන්, දිවෙන්, ශරීරයෙන්, සහ මනසින් එන්නාවූ අරමුණු කෙරෙයි කිසිම ප්‍රතිචාරයක් නොදක්වා උපේක්ෂාවෙන් බලන ගතිය. මේ ගතිය වෙන කෙනෙකුට ගන්න බෑ. රහතන්වහන්සේට පමණයි ඒ ගතිය තිබෙන්නේ. දවසක් රහතන්වහන්සේ කෙනෙක් කියලා එක්කෙනෙක් හිටියලු. ඒ හාමුදුරුවන්ව පරික්ෂා කරන්න රජ්ජුරුවෝ දෙහි ගෙඩියක් කපලා හාමුදුරුවන්ට පේන්න කැවලු. එතකොට ඒ හාමුදුරුවන්ගේ කටත් ඇද උනාලු. එතකොට දැනගෙන තිබෙනවා රහත්වහන්සේ කෙනෙක් නොවන බව. ඉස්සර එහෙම වැඩ කරලා තිබෙනවා. අර රජගහනුවර හිටපු සිටුවරයා කෝටුවක් උඩ පාත්තරයක් තබලා 'රහතන්වහන්සේ නමක් ඉන්නවා නම් ඇවිල්ලා ගන්න කියලා කිව්වේ' ඒ ගොල්ලො රවට්ටන හින්දා.

ඇත්තටම මේ නවසීලන්තෙට ඇවිල්ලා හිටියට මමත් එක එක උප්පරවැට්ටි කරපු කෙනෙක්. නරක දේවල්වලට නෙමෙයි. එකක් තමයි ඔය යන්ත්‍ර මන්ත්‍ර කරන විශ්ව බලයෙන් වෙදකම් කරන කට්ටිය ගාවට ගිහිල්ලා තිබෙනවා. කරුමෙට ඒ අය අපිව ප්‍රතික්ෂේප කරනවා. ඒ ගොල්ලන්ගේ මන්තර එකක්වත් අපිට අහන්නේ නෑ. ඒ ගොල්ලන්ගේ විශේෂ කාමර තියෙනවා පිටිපස්සේ. ඒ පැතිවල ඇවිදින්න යනවානම් අහනවා 'මොකද මේ පැත්තේ' කියලා. ඒ පැතිවල ඇවිදින්න දෙන්නේ නෑ.

එක කාලයක අපේ ආරණ්‍යයකත් ඔය වගේ ආර්ය භාවයට පත් වුනා කියල කියපු කෙනෙකුගෙන් ආර්ය උපවාද උනා කියලා අපිට සමාව ගන්නත් සිදු උනා. ඔක්කොටම නීතියක් දැම්ම ගිහිල්ලා එයාගෙන් සමාව ගන්න කියලා. ලොකු හාමුදුරුවෝ බලකරන නිසා අපි ගිහිල්ලා සමාව ගත්තා. අපි ගොඩක් බාලයි ඒක නිසා අපි ගිහිල්ලා සමාව ගත්තා. ඊට මාසයකට විතර පස්සේ ඒ කෙනා සිවුරු ඇරලා ගිහිල්ලා අවිස්සාවේල්ල පැත්තේ බේකරියක පාන් පුච්චනවා. ඊට පස්සේ දරුවෝ දෙන්නෙක් ඉන්න අම්මණ්ඩි කෙනෙකුට අහුවෙලා දෙවෙනි ස්වාමියා හැටියට ගිහිල්ලා, අර ආර්යන්වහන්සේ කියපු කෙනා. ඒවගේ ඒවා දැකලා අපි හොඳට පදන්වෙලා තියෙන්නේ. ඒක නිසාම තමයි අපි මේ ධර්මයට අනුව විනයට අනුව බලන්නේ. සමහර වෙලාවට අපි කරන වැඩත් එක්ක හිනහත් යනවා. නමුත් එහෙම විපරම් කරලා බලන්න ඕනේ. ඒවගේ කට්ටිය හිතන්නේ අපි මෝඩයෝ කියලා. ඒවගේ අයට හවස 5 හට විතර හොඳට කුකුළුමස් එක්ක බත් වේලක් දීලා බලන්න ඕනේ කොහොමද කියලා.

අපි සේනාසන වල ඉන්නවනේ. ගිහියෙක් සේනාසනයට ඉන්නකොට තට්ටු කරලානේ එන්නේ. අපිට වැරදි වැඩක් හැටියට ඔය බත් කනවා කියන එක හරි ඕනේ එකක් කරන්න පුළුවන්නේ. කවුද දකින්නේ. ඒ උනාට ශික්ෂා ගරුත්වයක් කියලා එකක් තියෙනවනේ. ආර්ය ධර්මයේ පිහිටි එක්කෙනාට ඒක හොඳටම පිහිටන්න එපායැ. මම නම් හිතන්නේ ඔය වගේ කපටිකම් කවුරුහරි දාල හරි පරික්ෂා කරන්න ඕනේ කියලා. ඔස්ට්‍රේලියාවේ මහත්තයෙක් එහෙම බැලුවා. මේ වෙන විට බලලා තියෙන්නේ. ඔය ආර්ය ආර්ය කියන අයට දුන්න කෑම. ඊට පස්සේ කට වචනයෙන් කියලත් තියෙනවා උදේටයි හැන්දෑවටයි ගේන්නත් කියලා. හැම එක්කෙනාම අත පොරවාගෙන ඉන්නේ නෑ. එක මහත්තයෙක් ඇවිල්ලා කිව්වා එයා දීපු පළවෙනි දානෙත් අවසන් දානෙත් ඒක තමයි කියලා. ඒක උනේ මාතර. ඒ කරපු වැඩේ හොඳ නෑ නමුත් එහෙම කරන මිනුස්සු ඉන්නවා. එයා දානයක් හදලා හාමුදුරුවෝ විසාල පිරිසක් ගෙන්නලා හිස් දසමුල අරිෂ්ට බෝතල් වලට දාලා ඔක්කොටෝම අරක්කු පෙව්වා. ඒ අයත් බිව්වා. ඔය වගේ අණ්ඩපාල වැඩ කරන අය ඉන්නවා. හැබැයි ඒක අපිට අණ්ඩපාල උනාට ඒ මනුස්සය කළේ පරීක්ෂණයක්, මේ අය අවංකද කියලා බලන්න.

<u>මහත්මයෙක්</u> - හාමුදුරුවෝ දන්නේ නැනේ අරක්කු බව

<u>ස්වාමීන්වහන්සේ</u> - දන්නවා. ඇයි මහත්තය නහය නැද්ද? සමානායයෙන් බීපු මනුස්සයෙක් ළඟට එනකොටත් ගඳයිනේ. ඒක කරලා ඒ මනුස්සය නිකන් හිටියේ නෑ. හතර වටේම කිය කියා ගියා. අපේ ගාවටත් ඇවිල්ලා කිව්වා. එයාට ඒකෙ පවක් තියෙනවා නමුත් එයාට විමර්ශන හිත තුබුණා.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස ඒකට තව කථාවක් කියනවා. බුදුහාමුදුරුවෝ මුලින්ම රෑට කන්න එපා කියලා පැනෙව්වේ නෑ. ඒක නිසා කමක් නෑ කියලා කියනවා.

<u>ස්වාමීන්වහන්සේ</u> - බුදුරජාණන්වහන්සේ ඉස්සරවෙලා ශික්ෂාපදයක් පැනෙව්වේ නෑ. ඒක හැබෑව. ඊට පස්සේ ශික්ෂාපදයක් පැනෙව්වා ආනිසංස කියලා. බුදුරජාණන්වහන්සේලා යම්කිසි ශිකෂාපදයක් පැනෙව්වා නම් ආර්යන් වහන්සේලා ඒක රකිනවා. බුදුරජාණන්වහන්සේලා දේශනා කරලා තියෙනවනේ 'මගේ ශ්‍රාවකයෝ ජීවිතය ගියත් සිල් පද කඩන්නේ නැහැ' කියලා.

ඇත්ත වශයෙන්ම මම නම් ඔය කියන බණ අහන්නේ නෑ. පොඩි පොඩි කෑලි ප්‍රශ්න හැටියට මගෙන් අහලා එවනවා. ඒ විදියට වචන දෙක තුනක් අහනවා ඇරෙන්න ඇත්ත වශයෙන්ම මම අහන්නේ නෑ. අනිත් එක තමයි ආර්ය උපවාදය කියන එකත් දැනගන්න ඕනේ. අනිත් එක තමයි සංඝ භේදය. මේවා දැන ගන්න ඕනේ. හේතුව අනිත් අය මේවා දාල වටකරලා, භය කරලා ඒගොල්ලන්ගේ දේවල් ස්ථාපනය කරනවා. අපි ධර්මයට එකතුව ජීවත් වෙන්න ඕනේ.

<u>අදහසක්</u> - ස්වාමීන්වහන්ස කාලය වෙනස් වෙනකොට ධර්මයත් විකෘති වෙනවා කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තිබෙනවා ..

<u>ස්වාමීන්වහන්සේ</u> - එහෙම එකකුත් දේශනා කළා නමුත් කාලය වෙනස් වෙද්දී ධර්මය විකෘති වෙනව කියලා කිව්වට අපි මුලා වෙන්න හොඳ නෑ. බුදුරජාණන්වහන්සේගේ දේශනාවල තියෙනවනේද වචනයක් ඇහුනොත් ඒක සූත්‍ර වලට විනයට ගලපලා බලන්න කියලා. එහෙම ගලපලා බලන්න අඩු නැතුව ධර්මය අපිට තියෙනවා. ධ්‍යානය කියන්නේ මොකක්ද, ඒකෙ තත්වේ මොකක්ද කියලා හොඳට තියෙනවා.

<u>මහත්යෙමක්</u> - ධර්මය වෙනස් කරලා දේශනා කරන කෙනෙක් කියලා තියෙනවා එයාට ඕනේ controversial වෙන්න කියලා. එයාට ඕනේ ගැටුමක් ඇති කරන්න.

<u>ස්වාමීන්වහන්සේ</u> - ආර්යන් වහන්සේලා එහෙම කරන්නේ නෑ. ඒක බරපතලයි. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා **'භික්ඛවෙ, සමග්ගා හොථ, මා විවදථ'** කියලා. මහණෙනි වාද කරන්න එපා. සමගි සම්පන්න වෙන්න කියලා. එහෙම කියලා තිබෙත්දිත් ඊට විරුද්ධ දෙයක් කරනවානම් ඒක ආර්යන් වහන්සේලාගේ ධර්මයට ගරු කිරීමක් නෙමෙයි.

තව එකක් තිබෙනවා - බිම්බිසාර රජ්ජුරුවෝ බුදුරජාණන්වහන්සේට ප්‍රකාශ කරනවා "ස්වාමීනි මට තරුණ කාලේ අස්සාස පහක් තිබුණා" කියලා. පළවෙනි අස්සාසය තමයි 'මට රජ කම ලැබේවා' කියලා. එතන අස්සාස කියන්නේ ප්‍රාර්ථනාව. ඕක තියෙන්නේ විනය පිටකයේ මහා වග්ග පාළියෙහි. අස්සාස කියන වචනයේ අස්වැසිල්ලක් කියන අර්ථයත් තියෙනවා. ආශ්වාස කියන අර්ථයත් තිබෙනවා, නමුත් 'ආශ්වාසය' = 'අස්සාස' කියන තැන වචනය හැදෙන හැටි වෙනස්.

හැමදෙනාම අද අදම නිවන් දකින එක හොඳයි හැබැයි මේ ධර්මය විනාස කරන්නනේ නැතුව. එච්චර තමයි මට කියන්න තියෙන්න.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස අර්ථ, ධර්ම, නිරුක්ති, පටිභාන කියන පටිසම්භිදා ඥානයන්හි පටිභාන කියන්නේ මොකක්ද?

<u>පිළිතුර</u> - ධර්මයයි එහි තිබෙන අර්ථයයි ඒකට පාවිච්චි කරන වචනයි යන ධර්ම තුන පිළිබඳව දැනීමක් තියෙනවා කියලා දැන ගන්නා නුවණට කියනවා පටිභාන පටිසම්භිදාව කියලා. පටිසම්භිදා ඥාන හතර විස්තර කරලා තිබෙන්නේ ඉන්ද්‍රිය ධර්ම, බොජ්ඣංග ධර්ම, මාර්ග ධර්ම වශයෙන්. ඇත්ත වශයෙන් මේ පිරිස අර්ථ ධම්ම නිරුක්ති ප්‍රතිභාන අනිවාර්යයෙන්ම දැනගත යුතුයි. සීලබ්බත පරාමාස කියන එකත් දැනගත යුතුයි.

උදාහරණයක් ලෙස 'සමාධි' කියන වචනය ගමු.

- සමාධි = අර්ථය (අර්ථයට කියන නම තමයි සමාධිය)
- භාවනා කිරීම = ධර්මය (ධර්මයට කියන නම තමයි භාවනාව)
- භාෂා දැනුම = නිරුක්ති

ධර්මය නම් වූ භාවනා කිරීම නිසා තමයි අර්ථය නම් වූ සමාධිය ඇති උනේ.

යම් කිසි කෙනෙකුට **'අර්ථයට'** කියන නම **'සමාධිය'** බවත් **'ධර්මයට'** කියන නම **'භාවනාව'** බවත් යම් කිසි දැනුමක් තිබෙනවා නම් එයට කියනවා **'නිරුක්ති ඥානය'** කියලා. එනම් **භාෂා දැනුම**.

යම් කිසි කෙනෙකුට අර්ථය මේකයි කියලා නුවණක් තිබෙනවානම් ඒකට කියනවා 'අර්ථය දකින්නාවූ නුවණ' කියලා. යම්කිසි කෙනෙකුට ඒක ඇතිවීමට හේතුව දකින්නාවූ නුවණ තිබෙනවා නම් කියනවා 'ධර්මය දකින්නාවූ නුවණ' කියලා. යම් කිසි කෙනෙකුට ඒකට කියන්නාවූ භාෂාවේ වචන ගැන දැනුමක් තිබෙනවා නම් ඒකට කියනවා 'නිරුක්ති ඥානය' කියලා.

තව වචනයක් ගමු

- බත් = අර්ථය
- හාල් = ධර්මය
- භාෂාව = නිරුක්ති
- පටිභාන

අර්ථයට වෙන නමකුත් ධර්මයට වෙන නමකුත් තිබෙනවා.

එතකොට යම්කිසි කෙනෙකුට දැනුමක් තිබෙනවා නම් බත් කියන කොට ඒ ගැන හොඳට තේරෙනවා නමුත් හාල් කියනකොට එයාට තේරෙන්නේ නෑ බත් කියලා. බත් කියනකොට එයාට තේරෙන්නේ නෑ හාල් කියලා. බත් කියන කොට අර්ථය තේරෙනවා. හාල් කියන කොට බත් හැදිච්ච ධර්මය තේරෙනවා. බත් කියන එකට මෙහෙම නමක් තිබෙනවා හාල් වලට මෙහෙම නමක් තියෙනවා කියලා දැනුමක් තිබෙනවා. ඒකට කියනවා භාෂා දැනුම කියලා. නැත්නම් කියනවා නිරුක්ති කියලා. මේ භාෂා දැනුමෙන් තේරෙනවා හාල් කියන්නේ 'ධර්මයක්', බත් කියන්නේ 'අර්ථයක්' කියලා. දැන් දැනුම් තුනක් තිබෙනවා. බත් කියන්නේ එක දෙයක්. හාල් කියන්නේ තව දෙයක්. භාෂාව කියන්නේ තවත් දෙයක්. 'බත්' භාෂාව නෙමෙයි. 'හාල්' භාෂාව නෙමෙයි. භාෂාව කියන්නේ ඒවා හඳුන්වන්න පාවිච්චි කරන එකක්. බත් කියන්නේ යම් කිසි දෙයක්, ඒක හැදෙන්නේ හාල් වලින් සහ ඒවාට කියන නම් එකිනෙකට වෙනස් දේවල් තුනක්. මේ තුනේ තිබෙන්නාවූ ප්‍රභේදයේ වෙනස් කම තේරුම් ගන්න එකට කියනවා **පටිභාන** කියලා. ඒකට කියනවා ඥානයේ ඥානය කියලා.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස එතකොට ඔය ඥානය මාර්ගඵල ලාභී උතුමන්ටත් සෝවාන් ඵලය ලබා ගත්තු ආනන්ද හාමුදුරුවන්ටත් තිබුණා නේද?

<u>පිළිතුර</u> - ඔව් ඒ ස්වාමීන්වහන්සේට හොඳට පෙර පිං තිබුණා. හැබැයි ඒ ස්වාමීන්වහන්සේලාගේ ඥානය ඔය වගේ කබල් ඒවා නෙමෙයි. අමුතු විකුර්ති නෑ.

<u>මහත්මයෙක්</u> - දැන් සිව්පිළිසිඹියාපත් රහතන්වහන්සේලා විසින් නම් මුලින්ම ධර්ම සංඝායනාව කළේ එතකොට ඒ වෙලාවේ යොදපු වචනයි, ඒ තේරුම් ටිකයි ඒ විදියටම එන්න ඕනෙනේ. අලුතින් නිරුක්ති දෙන්න අවශ්‍යතාවයක් නැනේ.

<u>ස්වාමීන්වහන්සේ</u> - ඇත්ත වශයෙන්ම වෙන වෙන වචන කෑලි කෑලි කඩ කඩා අර්ථ දෙන්න එහෙම අභේතියක් නෑ මේකේ. එහෙම දුප්පත් කමක් නෑ. හොඳට පරිපූර්ණව ධර්මය තිබෙනවා. අනිත් එක මෙච්චර කාලයක් එනම් අවුරුදු දෙදහස් පන්සියයක් තරම් කාලයක් ගිහිල්ල මේ තැන් තැන් වලින් අහුලා ගත්ත කඩතොළු වෙච්ච වචන කෑලි ඕකට හඟි කරන්න ඕනේ නෑ. ඊට ඉස්සෙල්ලා ධර්මය අවබෝධ කරගත්තු ස්වාමීන්වහන්සේලා කොච්චර හිටියද.


දැන් බලන්න, ඇත්ත වශයෙන්ම වෛද්‍ය විද්‍යාව කියන්නේ, ඉංජිනේරු ශාස්ත්‍රය කියලා කියන්නේ, කලාව කියලා කියන්නේ, උයන පිහන දේවල් කියලා කියන්නේ ලෞකික එදිනෙදා ජීවිතේට හොයාගත්තු දේවල්. ඒකෙන් කොහොමද ආර්යන්වහන්සේ නමකගේ හිතේ පහළ වෙච්ච ආර්ය අවබෝධයන් තීරණය කරන්නේ. ඕකේ තියෙන්නේ වෙන ප්‍රශ්නයක් මට දැනෙන හැටියට. ඒ තමයි හීන මානය තියෙනවා. වචන වලට යන්නේ හීන මානයෙන්. ධර්මය ප්‍රකාශ කරන්නේ අධිමානයෙන්. හීන මානය කියලා කියන්නේ, දැන් මෙතන වෛද්‍යවරු ඉන්නවා ඉංජිනේරුවරු ඉන්නවා ගණකාධිවරු ඉන්නවා. හොඳ හොඳ රස්සාවල් කරපු අය ඉන්නවානේ නේද? සෝවාන් වෙන්න පුළුවන් උනාද? ධ්‍යානයක් ලබාගන්න පුළුවන් උනාද? අඩු තරමේ චිත්ත සමාධියක්? තිබ්බ්ච්ච එකත් නැතිවෙච්ච එකනේ උනේ. එතකොට බලන්න, වචන ගත්තහම 'වෙද මහත්තය' කිව්වහමයි 'ඩොක්ටර්' කිව්වහමයි වැඩියෙන් ගණන් ගන්නේ ඩොක්ටර් කියන එක. වෙදමහත්තයා කරන්නේ ලෙඩ්ඩු මරණ එකද? නැනේ සනීප කරන එක. දොස්තර කරන්නෙත් සනීප කරන එක. හැබැයි වෙදමහත්තයා කියන එක සිංහල එකක්. ඒකට තැනක් එන්නේ නෑ. ඩොක්ටර් කිව්ව ගමන්ම එතෙන්ට

යනවා. දැන් බලන්න, අර අපේ ගමේ ඇල හදපු එක්කෙනා මෙයා කියලා කිව්වොත් එයාට තැනක් එනවද? නැනේ. ඇලවල් හදනවා කියන එකේ තේරුම මොකක්ද? Irrigation engineering. බුදුරජාණන්වහන්සේගේ කාලේ ඇලවල් හැදුවේ නැත්ද? අනුරාධපුර යුගයේදී ඇලවල් හැදුවේ නැත්ද? ඔය වැව් බැන්දේ Oxford ගිහිල්ලා ඉගෙන ගත්තු අයද? පිට රටවල් වල ගිහිල්ල ඉගෙන ගත්තු අය නෙමෙයිනේ ඒවා කළේ. අදත් කන්නේ, අනුරාධපුරේ පොළොන්නරුව පැත්තේ ගොයම් පැහෙන්නේ ඒ බැඳපු වැව් වල පිහිටෙන්. සාමාන්‍යයෙන් හිතලා බලන්න. ඒ උනාට ඒ ගොල්ලෝ ඇලවල් වල වතුර හැරෙව්වොත් ඇලවල් සුද්ද කළොත් ගණන් ගන්නවද? නෑ. හැබැයි ඉංජිනේරු කියලා කිව්වොත් පිළිගැනීමක් තියෙනවා. ඒවගේ මේකේ තියෙන්නේ හීන මානයක්. හීන මානය කියන්නේ වෙදමහත්තයා කිව්වොත් තැනක් නෑ. අර පොත්පත් වල වැඩ කරන ගණන් හදන එක්කෙනා කිව්වොත් වැඩක් නෑ. ගණන් ගන්නේ නෑ. Accountant කියන්න ඕනේ. ඩොක්ටර් කියන්න ඕනේ. ඒවගේම engineer කියන්න ඕනේ. හොඳට හිතන්න බලන්න ඉස්සර මිනිස්සු පාරවල් හැදුවේ නැත්ද? හැදුවා. ඒ උනාට අපේ පාර දාපු එක්කෙනා කියන එකයි ඉංජිනේරු මහත්තය කියන එකයි ගත්තහම දෙකක්. ඒක නිසා අපි වචනයට හැමවෙලේම බාල්දු වෙලා ඉන්නේ. හොඳට අමු අමුවේ තිබෙනවා අපි අත්විඳින දේ. ඒ උනාට ඒ වචනයෙන් ඒ සත්‍යය පිළිගන්න කැමති නෑ . දැන් ඉස්කෝල බලන්න. ගමේ ඉස්කෝලෙට ගිහිල්ලා ඉගෙනගෙන හොඳ තත්වයට පත් උනත්, ඒ මනුස්සයා ලෝකයට හොඳ වැඩදායක දෙයක් සිද්ධ කරත් එයාව ගණන් ගන්නේ නැනේ. රෝයල්, ආනන්ද, විසඛා කිව්වොත් එහෙම මොන මොට්ට මෝඩ වැඩේ කරත් ගණන් ගන්නවා. මේ මට හිතෙන තාලේ. කවුරුහරි පිටරටින් වචනයක් දීපු ගමන් ඒක බාර ගන්නවා. ඔය ඉංජිනේරු වචනේ ආවේ කොයි කාලෙද? හතලිස් ගණන්වල. බලන්න ඒ වචනේ කොච්චර ගැම්මට ගියාද කියලා. ඉංජිනේරුවන්ට අගෞරව කරනවා නෙමෙයි. ඒ දැනුම හොඳයි. නමුත් අපි හඳුන්වා දෙන්නේ ඒ වචනයෙන්. අපි කියන්නේ නැනේ පාරවල් වල වැඩ කරන්නේ කියලා. එහෙම එකක් තියෙනවා. ඒක හීන මානය. අධි මාන්‍ය කියන එක ආර්ය ධර්මත් එක්ක එන එකක්.

ඒක නිසා ආර්ය අනාර්ය භාවය තේරුම් ගන්න ඕනේ. සත්පුරුෂ අසත්පුරුෂ ස්වභාවය තේරුම් ගන්න ඕනේ. ධර්මය අධර්මය තේරුම් ගන්න ඕනේ. තව ගොඩක් දේවල් තිබෙනවා, පැනවීම් ආදී දේවල් . අපි ඉස්සරහදි හෙමිහිට කථා කරමු.

තෙරුවන් සරණයි!

# සාධු! සාධු! සාධු!



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි